# 2023-03-14 වන දින පැවති ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාවේ
# මහා සභා රැස්වීම් වාර්තාව

**මෙදින පෙ.ව.10.00 ට පමණ මහා සභා රැස්වීම ආරම්භ වූ අතර පහත නම් සඳහන් ගරු සභික මහත්ම මහත්මීන් සහභාගී විය.**

| අනු අංකය | නම | තනතුර |
|---|---|---|
| 1. | ඩබ්ලිව්.එල්.රුවන් ලියනගේ මැතිතුමා | ගරු සභාපති (වැ.බ) |
| 2. | ඩබ්ලිව්. අශෝක ගුණරත්න මැතිතුමා | සභික |
| 3. | ආර්.ධනරත්න මැතිතුමා | සභික |
| 4. | අනුර ගාමිණී හෙට්ටිආරච්චි මැතිතුමා | සභික |
| 5. | එස්.කරුණාදාස මැතිතුමා | සභික |
| 6. | ජී.එච්.සුජීව විජේසූරිය මැතිතුමා | සභික |
| 7. | ජී.කේ.හරිස්චන්ද්‍ර මැතිතුමා | සභික |
| 8. | පී.ආරියවංශ මැතිතුමා | සභික |
| 9. | කුමුදු නිල්මිණී රේණුකා මැතිනිය | සභික |
| 10. | එච්.සුමිත් ප්‍රේමචන්ද්‍ර මැතිතුමා | සභික |
| 11. | ජී.එම්.දිලීන් සමුදිත කරුණාපාල මැතිතුමා | සභික |
| 12. | මොහොමඩ් රාෆි මැතිතුමා | සභික |
| 13. | ආර්.ජී.නන්දසේන මැතිතුමා | සභික |
| 14. | කේ.ගයානි ප්‍රියදර්ශනී කුමාරගේ මැතිණිය | සභික |
| 15. | එස්.එල්.ඩී.ශිරාන් සමරතුංග මැතිතුමා | සභික |
| 16. | සුනේත්‍රා රංජනී කරුණාරත්න මැතිනිය | සභික |
| 17. | එම්.ජී.වානක විජේරත්න මැතිතුමා | සභික |
| 18. | රසිකා වසන්ති සිරිවර්ධන මැතිණිය | සභික |
| 19. | **සුගත් හෙන්ඩ්‍රි හැන්ඩ්‍රිෂන් මැතිතුමා** | සභික |
| 20. | සනත් ප්‍රියන්ත සිරිසේන මැතිතුමා | සභික |
| 21. | රේවතී නන්දා මැතිණිය | සභික |
| 22. | යූ.එල් නුවන් මහේෂ් රත්නායක මැතිතුමා | සභික |
| 23. | එච්.ටී.තිලකරත්න මැතිතුමා | සභික |
| 24. | කේ.ජී.එන්.එන්. කස්තුරිආරච්චි මැතිණිය | සභික |
| 25. | මනෝජ් ප්‍රසාද් වෙලගෙදර මැතිතුමා | සභික |
| 26. | චමිල් නිශාන්ත දිසානායක මැතිතුමා | සභික |

නොපැමිණි,

| | | |
|---|---|---|
| 1. | රසිකා අරුණකාන්ති මැතිනිය | සභික |
| 2. | ඩබ්.වී.ඩබ්. පේමචන්ද්‍ර මැතිතුමා | සභික |

**01. ටී.ආර්.සී.කේ.ගුණසේකර මයා - ලේකම්**

**සභාපතිතුමා :-**

අද දින මහා සභාව වෙනුවෙන් සැපැමිණි ඔබ සියළු දෙනාම ඉතාම ආදරයෙන් පිළිගන්නවා. මුලින්ම ඇත්තේ ආගම සිහි කිරීමයි.

**01. පසුගිය රැස්වීමේ වාර්තා සම්මත කිරීම.**

**i. 2023-02-14 දිනැති මහා සභා රැස්වීම් වාර්තාව**

**ii. 2023-02-27 දිනැති විශේෂ මහා සභා රැස්වීම් වාර්තාව**

**සභික අනුර ගාමිණී හෙට්ටිආරච්චි මැතිතුමා:-**

2023-02-14 **දිනැති මහ සභා රැස්වීම් වාර්තාව** මම ස්ථිර කරනවා.

විරෝධතා තිබේනම් දැනුම් දෙන්න.
නිහඩතාවයෙන් පෙනී යන්නේ විරෝධතා කිසිවක් නොමැති බවයි.

**ඒ අනුව,** 2023-02-14 **දිනැති මහා සභා රැස්වීම් වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.**

**සභික පී.ආරියවංශ මැතිතුමා:-**

**2023-02-27 දිනැති විශේෂ මහා සභා රැස්වීම් වාර්තාව** මම ස්ථිර කරනවා.

විරෝධතා තිබේනම් දැනුම් දෙන්න.
නිහඩතාවයෙන් පෙනී යන්නේ විරෝධතා කිසිවක් නොමැති බවයි.

**ඒ අනුව, 2023-02-27 දිනැති විශේෂ මහා සභා රැස්වීම් වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.**

## 02. සභාපතිවරයා විසින් කරනු ලබන විශේෂ නිවේදන

**සභාපතිතුමා :-**

ඔබතුමන්ලාට විශේෂ දැනුවත් කිරීමක් සිදුකිරීමට තිබෙනවා. මෙතුවක් කලක් ඇහැලියගොඩ නගරයේ පැවති අවිධිමත්භාවය නැති කිරීම සඳහා අප විසින් සියළුම බස් රථ පොළ භූමියට ඇතුලත් කිරීමට පියවර ගනු ලැබුවා. එහිදී ඇහැලියගොඩ අවිස්සාවේල්ල සහ ඇහැලියගොඩ රත්නපුර බස් රථ හිමියන් මේවන විට පොළ භූමියට ගොස් නැහැ. අද දිනත් පොලිසියට පිරිසක් පැමිණ විවිධ හේතූන් ප්‍රකාශ කරනු ලැබුවා.**ඔවුන් සැම විටම මහජනතාවගේ පහසුකම් පිළිබඳ නොසිතා විවිධ දේ ප්‍රකාශ කරනු ලබනවා. කඩ මණ්ඩියක් ගානේ අපිට බස් නැවතුම්පලවල් සෑදීමට නොහැකියි. එම නිසා අපේ නගර සංවර්ධනයටත් යෝජිත ස්ථානයක් තමා පොළ භූමිය. පැරණි පොළ භූමියත් බස් නැවතුම්පලට අයත් වෙනවා. එහි යම් නඩු කටයුත්තක් පවතින බැවින් පොළ භූමිය පමණක් භාවිතා කර බස් රථ එම ස්ථානයෙන් ගමන් ආරම්භය සහ ගමනාන්තය සිදුකිරීමට කටයුතු සිදුකර තිබෙනවා.** එම නිසා විවිධ **ප්‍රදේශ**වල බස් රථ එම ස්ථානයෙන් ගමන් ආරම්භ කරනවා.නමුත් ඇහැලියගොඩ අවිස්සාවේල්ල සහ ඇහැලියගොඩ රත්නපුර බස් රථ හිමියන් කාගිල්ස් ෆුඩ් සිටිය අසල සහ ප්‍රාදේශිය සභාව අසල තිබෙන බස් නැවතුම්පල මග හැරීමක් සිදුවන බව පවසනවා. පිටස්තර බස් රථ මගින් එම සෙනඟ ලබාගන්නා බවත් පවසනවා. ඔවුන්ගේ මතය එයයි. ඒ සඳහා විසඳුමක් ලබාදෙන ලෙස පවසනවා. ප්‍රාදේශිය සභාව අසල තිබෙන බස් නැවතුම්පල ඉදිරියට රැගෙන යන ලෙසත් පවසනවා. එය සිදුකල නොහැකියි. මක් නිසාද මෙම ස්ථානයෙන් ඉදිරියට බස් නැවතුමක් ඉදිකිරීමට ස්ථානයක් නැහැ. අස්ගඟුල පාර සහ නැදුරන හන්දිය අසල බස් නැවතුමක් සෑදීමට නොහැකියි. අනෙක් කරුණ මෙම බස් නැවතුම්පල ඉවත් කලහොත් පාසල් දරුවන් සහ අනෙකුත් අය අපහසුතාවයටත් පත් වෙනවා. ෆුඩ් සිටිය අසල යෝජිත බස් නැවතුම්පලක් නැහැ. එම නිසා එම බස් නැවතුම්පල ඉවත් කිරීමට හැකියාවක් පවතිනවා.මම බස් රථ හිමියන්ට පවසා සිටියේ බස් රථ පොළ භූමියට ගාල් කර පොළ භූමියෙන් ගමන ආරම්භය සහ ගමනාන්තය සිදුකරන්න. එම ස්ථානයෙන් පිටත්ව මගීන් තමන්ට අවශ්‍ය ස්ථාන වලට යාවි කියා. මගීන් බැංකුවට යනවා,රෝහලට යනවා කියලා ඒ සැම තැනම බස් නැවතුම්පලවල් සෑදීමට නොහැකියි අපිට. අවිස්සාවේල්ල නගරයේත් බස්නැවතුම්පල තිබෙන්නේ මෙහා කොනක. නමුත් මගීන් විවිධ අවශ්‍යතා වෙනුවෙන් එම ස්ථානයෙන් බැස ගමන් කරනවා. රත්නපුරෙත් තිබෙන්නේ කොනක.ඇහැලියගොඩ නගරයේ මැද අපි බස් නැවතුම්පල සාදාතිබෙන්නේ. එය තවත් පහසුවක්. එම නිසා අද දින පොලිසියට පැමිණි අය පවසා සිටියේ පෙර පරිදිම ඔවුන්ට සිදුකරගෙන යාමට ඉඩ ලබාදෙන ලෙස. එය සිදුකල නොහැකියි. මගීන්ට සනීපාරක්ෂක පහසුකම් තිබෙන ස්ථානයක බස් නැවතුම්පල ස්ථාපිත විය යුතුයි.විශේෂයෙන්ම කාන්තාවකට වැසිකිළියකට යාමට අවශ්‍ය වූ විට එම පහසුකම තිබිය යුතුයි. එම නිසා මම අද දින එම බස් රථ හිමියන්ට පවසා සිටියා මෙම තීරණය සභාවේ කතා කර සභා තීරණයක් රැගෙන පසුව සභාවේදීම කමිටුවක් පත්කර එම කමිටුවට සභාපතිවරයෙක් පත් කර එම කමිටුව එක්වී ලබාගත් තීරණය නැවත මහා සභාවට යොමුකර සභාවේද සභා සම්මතකර තමා මෙම තීරණය ක්‍රියාත්මක කිරීමට අප කටයුතු කළේ. එම නිසා කමිටුවට මෙම ගැටළුව යොමුකර ඒ මගින් විසඳාගත යුතු බව.එම නිසා මම ඔවුන්ට ඉල්ලීමක් සිදු කළා එක සතියක් බස් රථ පොළ භූමියෙන් ගමන් ආරම්භකර බලමුය කියා.ඊයේ දිනයෙත් මම එම ස්ථානයට යන විට විශාල සෙනඟක් පොළ භූමියේ සිටියා. අනෙක් කරුණ මෙම ගෞරවනීය සභාවේ සකච්ඡා කිරීමකින් තොරව මම කිසිඳු තීරණයකට එළඹෙන්නේ නැහැ. එබැවින් මේ පිළිබඳව ඔබතුමන්ලාගේ අදහස් සාකච්ඡා කිරීමට මම කැමතියි.

**සභික ශීරාන් සමරතුංග මැතිතුමා:-**

**සභාවේ කමිටුව ගත් තීරණයට එකඟ විය යුතුයි. නොමැතිනම් අපි සභාව පවත්වා වැඩකුත් නැහැ.කමිටු පවත්වා වැඩකුත් නැහැ .එමනිසා** මෙම ගෞරවනීය සභාවෙන් ලබාගත් තීරණය ඔවුන් වෙනස් කල යුතු නැහැ.එම නිසා මෙම තීරණය ක්‍රියාවට නැංවීමට අප සැදී පැහැදී සිටිමු.

**සභික අනුර ගාමිණී හෙට්ටිආරච්චි මැතිතුමා:-**

රත්නපුර බස්රථ සඳහා පොලිසිය අසලට ගොස් හරවා ඒමට හැකියාව තියෙයි. අවිස්සාවේල්ල බස්රථ වලටත් පුළුවන් යාය පාර අසලින් හෝ කැමති ස්ථානයකින් හරවා ආපසු ඒමට. සාමාන්‍යයෙන් එසේ තමා සිදුවිය යුත්තේ.

**සභික චමිල් නිශාන්ත දිසානායක මැතිතුමා:-**

මෙය අලුත් අදහසක් නිසා සමහර පුද්ගලයින්ට මෙය පුරුදු නැති විය හැකියි. නමුත් මිනිසුන් මෙයට අනුගත වූ පසු මෙය ගැටළුවක් වන්නේ නැහැ. එම නිසා කමිටුවක් මගින් ලබාගත් තීරණය වෙනස් කල යුතු නැහැ.

**සභික රේවතී නන්දා මැතිනිය :-**

මෙය කිහිප දෙනෙකුගේ වුවමනාවට සිදුකරන යෝජනාවක්. එමනිසා බල ප්‍රදේශයේ මහජනතාවගේ සුභසිද්ධිය උදෙසා අප විසින් ගනු ලැබූ තීරණය වෙනස් නොකරන ලෙස ඉල්ලා සිටිනවා.

**සභික පී.ආරියවංශ මැතිතුමා:-**

පුද්ගලික සහ ලංගම බස්රථ සංගම් සභාපතිතුමන්ලා ගෙන්වාගෙන ඔවුන් ඉදිරියේදී ලබාගත් තීරණයක් මෙය. එවිට ඔවුන් විරුද්ධ වුනේ නැහැ. විරුද්ධ වී තිබෙන්නේ බස් රියදුරු සහ කොන්දොස්තර මහතුන්. ඔවුන් කාලයෙන් කාලයට වෙනස් වෙනවා. එම නිසා සභාව මගින් ලබාගත් තීරණයක් මොනම හේතුවක් නිසාවත් වෙනස් විය යුතු නැහැ. නොමැතිනම් ඉදිරියේදී ලබාගන්නා තීරණත් ජනතාව නොසලකා හරීවි.

**සභික එස්.කරුණාදාස මැතිතුමා:-**

මාර්ග සංවර්ධන අධිකාරිය තමයි මෙහි වැරැද්ද සිදුකර තිබෙන්නේ. වේලාව පිළිබඳ ගැටළුවක් මෙය. එමනිසා වේලාව සංසන්දනය කර බලා විසඳාගත යුතුයි. අප ලබාගත් තීරණය වෙනස් නොකරන ලෙස ඉල්ලා සිටිනවා.

**සභික එච්.ටී.තිලකරත්න මැතිතුමා:-**

කමිටුව හරහා ගනු ලැබූ තීරණයට මෙම සභාව තුළ කිසිදු විරුද්ධත්වයක් නොමැති බව පැහැදිලියි. බස්රථ හිමියන්ට අවශ්‍ය ආකාරයට අප ලබාගත් තීරණය වෙනස් කල යුතු නැහැ. අවශ්‍යනම් රත්නපුර බස් රථ මෝරගල පල්ලිය අසලට ගොස් ආපසු හරවාගෙන මගීන් රැගෙන යන ලෙස පවසන්න.

**සභික ජී.කේ.හරිස්චන්ද්‍ර මැතිතුමා:-**

මම මීට පෙරත් පැවසුවා ලංකාවේ මිනිසුන්ට අලුතින් දෙයක් හඳුන්වා දෙන විට එයට අනුගත වීම අපහසුයි. උදාහරණයක් ලෙස IMF ණය රැගෙන ලංකාවේ ආර්ථිකය හදන විට උද්ඝෝෂණය කරනවා. IMF එකෙන් කියන්නේ ලංකාවේ මූල්‍ය විනය හදන්න කියලා. ඒ වගේ වැඩක් තමා මේකත්. මෙහිදී බස් හිමියන් හා වෙළඳසැල් හිමියන් තේරුම්ගත යුතුයි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව ඇහැලියගොඩ ප්‍රාදේශිය සභාවට යම්කිසි බලයක් ලබාදී තිබෙනවා. සභාපතිතුමාට බලයක් තිබෙනවා. සභාපතිතුමා කමිටුවට බලයක් ලබාදී තිබෙනවා. එවිට මේවායින් යම් යම් තීන්දු තීරණ ගනු ලබන්නේ මහජනතාව අපහසුතාවයට පත්කිරීමට නොවෙයි. මහජනතාවට සෙතක් සැලසීමට.අපි අසංවේදී මිනිසුන් නොවෙයි. බස් හිමියන්ට ගැටළු තිබෙනවා නම් අපිට මුදල් ලබාදුන්නා වැනි  අභූත චෝදනා නොකර හොඳින් කතා කරන්න කියන්න. ඊයෙත් මම කියා සිටියේ සභාවට යෝජනාවක් දමන්න .එවිට අපි සාකච්ඡා කරමුය කියා.එසේ නොමැතිව ඔබතුමාට ගහනවා,සභාවට ගහනවා,උද්ඝෝෂණ කරනවා කියා තර්ජනය කිරීම වැරදියි. කඩයක් කඩයක් ගානේ බස් නැවතුම්පලවල් සෑදීමට බැහැ අපිට. සියලුම රාජ්‍ය ආයතන සමඟ එක්ව ලබාගත් තීරණයක් මෙය. ඔවුන් ඉල්ලා සිටින්නේ සාධාරණ හේතුන් නම් නීත්‍යානුකූලව මෙම ස්ථානයට පැමිණ කථා කල යුතුයි. ඉදිරියේදී ගරු ආණ්ඩුකාරතුමා සමඟ සාකච්ඡා කර බස් නැවතුම්පල යහපත් ලෙස ජනතාවට තම අවශ්‍යතාවයන් සිදුකර ගැනීමට අවශ්‍ය සියලු පහසුකම් සැලසීමට බලාපොරොත්තු වෙනවා.

**සභික ආර්.ධනරත්න මැතිතුමා:-**

ප්‍රදේශයේම ජනතාවගේ යහපත වෙනුවෙන් ප්‍රාදේශිය සභාවම ලබාගත් මෙම තීරණය වෙනස් කරන්න එපා. අපේ බලය නිසියාකාරව භාවිතා කරන්න.නගරයේ රියදුරෙක් ලෙස මමත් අවස්ථා ගණනාවක බසයෙන් බැස වැසිකිළියක් සොයමින් ලතවෙන මිනිසුන් එම ස්ථාන වෙත රැගෙන ගොස් තිබෙනවා. නමුත් මෙම යෝජනාව නිසා එම ගැටළුව අවම වෙනවා.බස් නැවතුම්පලේ නිසි ලෙස සනීපාරක්ෂක පහසුකම් තිබෙනවා. මේ නිසා නගරයේ තදබදයද අඩු වී තිබෙනවා .හරිස් මැතිතුමා පැවසූ ලෙස අපේ මිනිසුන්ට යමක් හුරු වීමට කාලයක් ගත වෙනවා.

**සභික හරිස්චන්ද්‍ර කිරිඇල්ල මැතිතුමා:-**

දිද්දෙනිය බස් රථය හුඩ් සිටිය අසල නවත්වන විට අපි දන්නවා කුමන කඩයටද වැඩිපුර වාසි සහගත කියලා .කඩ හිමියන්ට තීරණය කල නොහැකියි බස් නවත්වන ස්ථාන පිළිබඳව.

**සභික දිලීන් සමුදිත කරුණාපාල මැතිතුමා:-**

සියලු පහසුකම් සහිතව බස් නැවතුම්පලක් සෑදීම ඉතා හොඳ කාරණයක්. අනෙක් කරුණ මෙම යෝජනාව නිසා අපට නොපෙනෙන ව්‍යාපාරික අවස්ථා උදා වී තිබෙනවා. පදික වෙළඳුන් පොළ භූමියට රැගෙන ගොස් පදික වෙළඳාම නැවැත්විය හැකියි. තවද මෙම 2023 වසරේ ලබාගත් තීරණය අනාගතයේදී නගර සැලසුම අනුව වෙනස් විය හැකි බවද ඔවුන්ට පැහැදිකර දිය යුතුයි.

**සභාපතිතුමා:-**

මෙය ඉතාම කාලෝචිත තීරණයක් බැවින් වෙනස් කල යුතු නැහැ. නගරය තුළ තිබෙන පදික වෙළඳාමත් අපි බොහෝ දුරට ඉවත්කර තිබෙනවා. මාර්ගයේ ගමන් කරන මිනිසුන්ගේ අපහසුතවය,අනතුරු පිළිබඳව පදික වෙළඳුන් සලකන්නේ නැහැ. මේ අවස්ථාවේදී එම බස් රථ හිමියන් පැමිණ සිටිනවා කතා කිරීමට. එය සුදුසුද කියා ඔබතුමන්ලාගෙන් අසා සිටිනවා. ඔවුන් පැමිණෙන තෙක් ඉදිරි කටයුතු සිදුකරගෙන යමු.

**03. ප්‍රාදේශිය සභාව අමතා එවන ලද සංදේශ ,පෙත්සම්,පැමිණිලි හා සන්නිවේදන**

**04. යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න -නැත**

**05. යථා පරිදි කල් දී ඇති යෝජනා**

**i. 2023-02-01 දිනැති මුදල් සහ ප්‍රතිපත්ති සැකසීමේ කමිටු වාර්තාවේ නිර්දේශ අනුමත කිරීම. -ගරු සභාපතිතුමා**

**සභාපතිතුමා :-**

2023-02-01 දිනැති මුදල් සහ ප්‍රතිපත්ති සැකසීමේ කමිටු වාර්තාවේ නිර්දේශ අනුමත කිරීමට සභාවට යෝජනා කරනවා.

**සභික ආර්.ඒ.නන්දසේන මැතිතුමා :-**

එම යෝජනාව මම ස්ථිර කරනවා.

**සභාපතිතුමා :-**

විරෝධතා තිබේනම් දැනුම්දෙන්න.
නිහඬතාවයෙන් පෙනී යන්නේ විරෝධතා කිසිවක් නොමැති බවයි.

**ඒ අනුව, 2023-02-01 දිනැති මුදල් සහ ප්‍රතිපත්ති සැකසීමේ කමිටු වාර්තාවේ නිර්දේශ අනුමත කිරීමට ඒකමතිකව සභා සම්මත විය.**

ii. **2023-02-08 දිනැති මුදල් සහ ප්‍රතිපත්ති සැකසීමේ කමිටු වාර්තාවේ නිර්දේශ අනුමත කිරීම. -ගරු සභාපතිතුමා**

**සභාපතිතුමා :-**
2023-02-08 දිනැති මුදල් සහ ප්‍රතිපත්ති සැකසීමේ කමිටු වාර්තාවේ නිර්දේශ අනුමත කිරීමට සභාවට යෝජනා කරනවා.

**සභික ආර්.ඒ.නන්දසේන මැතිතුමා:-**
එම යෝජනාව මම ස්ථිර කරනවා.

**සභාපතිතුමා :-**
විරෝධතා තිබේනම් දැනුම්දෙන්න.
නිහඬතාවයෙන් පෙනී යන්නේ විරෝධතා කිසිවක් නොමැති බවයි.

**ඒ අනුව, 2023-02-08 දිනැති මුදල් සහ ප්‍රතිපත්ති සැකසීමේ කමිටු වාර්තාවේ නිර්දේශ අනුමත කිරීමට ඒකමතිකව සභා සම්මත විය.**

iii. **2023-02-22 දිනැති මුදල් සහ ප්‍රතිපත්ති සැකසීමේ කමිටු වාර්තාවේ නිර්දේශ අනුමත කිරීම. -ගරු සභාපතිතුමා**

**සභාපතිතුමා :-**
2023-02-22 **දිනැති මුදල් සහ ප්‍රතිපත්ති සැකසීමේ කමිටු වාර්තාව** සඳහා මහ සභා අනුමැතිය ලබා ගැනීම **සභාවට යෝජනා කරනවා.**

**සභික ආර්.ඒ.නන්දසේන මැතිතුමා:-**
එම යෝජනාව මම ස්ථිර කරනවා.

**සභාපතිතුමා :-**
විරෝධතා තිබේනම් දැනුම්දෙන්න.
නිහඬතාවයෙන් පෙනී යන්නේ විරෝධතා කිසිවක් නොමැති බවයි.

**ඒ අනුව, 2023-02-22 දිනැති මුදල් සහ ප්‍රතිපත්ති සැකසීමේ කමිටු වාර්තාවේ නිර්දේශ අනුමත කිරීමට ඒකමතිකව සභා සම්මත විය.**

iv. **2023-02-06 දිනැති දිනැති ප්‍රසම්පාදන කමිටු වාර්තාවේ නිර්දේශ අනුමත කිරීම. -ගරු සභාපතිතුමා**

**සභාපතිතුමා:-**
**2023-02-06 දිනැති දිනැති ප්‍රසම්පාදන කමිටු වාර්තාව සඳහා මහ සභා අනුමැතිය ලබාගැනීම සභාවට යෝජනා කරනවා.**

**සභික ආර්.ඒ.නන්දසේන මැතිතුමා:-**
එම යෝජනාව මම ස්ථිර කරනවා.

**සභාපතිතුමා :-**
විරෝධතා තිබේනම් දැනුම්දෙන්න.
නිහඬතාවයෙන් පෙනී යන්නේ විරෝධතා කිසිවක් නොමැති බවයි.

**ඒ අනුව, 2023-02-06 දිනැති ප්‍රසම්පාදන කමිටු වාර්තාව සඳහා මහ සභා අනුමැතිය ලබාගැනීම ඒකමතිකව සභා සම්මත විය.**

v. **ප්‍රාදේශිය සභා බල ප්‍රදේශය තුළ නිවාස හා නගර සංවර්ධන ආඥා පනත ක්‍රියාත්මක වන ප්‍රදේශයක ඉඩම් සැලසුම් ,ඉඩම් අනුබෙදුම් සැලසුම් හා ගොඩනැගිලි සැලසුම් පරීක්ෂා කිරීම ,අනුමත කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව සඳහා මහා සභා අනුමැතිය ලබාගැනීම - ගරු සභාපතිතුමා**

**සභාපතිතුමා:-**

**ප්‍රාදේශිය සභා බල ප්‍රදේශය තුළ නිවාස හා නගර සංවර්ධන ආඥා පනත ක්‍රියාත්මක වන ප්‍රදේශයක ඉඩම් සැලසුම් ,ඉඩම් අනුබෙදුම් සැලසුම් හා ගොඩනැගිලි සැලසුම් පරීක්ෂා කිරීම ,අනුමත කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව සඳහා මහා සභා අනුමැතිය ලබාගැනීම පිළිබඳ යෝජනාව සභාවට යෝජනා කරනවා.**

**සභික පී.ආරියවංශ මැතිතුමා :-**

එම යෝජනාව මම ස්ථිර කරනවා.

එමෙන්ම මෙය ඉතාම කාලෝචිත අතුරු ව්‍යවස්ථාවක් .මීට පෙර ගෙන ආවානම් ඉතාමත් හොඳයි. ඉඩම් කොටස් කිරීමේදී පදිංචිකරුවන්ට පහසුකම් තිබෙන ආකාරයෙන් සෞඛ්‍යාරක්ෂිත විධිවිධාන අනුව සැදිය යුතුයි කියා මෙහි තිබෙනවා. අපි දන්නවා ඉඩම් කට්ටිකර විකිණීමේදී අපට ලැබිය යුතු ඉඩම් ප්‍රමාණය ලැබෙන්නේ නැහැ. නමුත් මෙහි තිබෙනවා කට්ටි කර අලෙවි කිරීමට පෙර සභාවට ලැබිය යුතු ඉඩම් කොටස තෑගි ඔප්පුවකින් සභාව සතුකළ යුතු බව.එම නිසා සෑම කාරණයක් පිළිබඳවම මෙහි ඇතුලත්ව තිබෙනවා.

**සභික දිලීන් සමුදිත කරුණාපාල මැතිතුමා:-**

ආරියවංශ මැතිතුමා කියූ ලෙස මෙය හොඳ අතුරු ව්‍යවස්ථාවක්. නමුත් මාහට පොඩි පැහැදිලි කිරීමක් සිදුකර ගැනීමට තිබෙනවා. .07වෙනි වගන්තියේ තිබෙනවා නේවාසික අවශ්‍යතා සඳහා බිම් කොටසක් වෙන්කර තිබෙන බව.පර්චස් 04ක් නැත්නම් පර්චර් 1,2සහ 3 බිම් කොටස් වෙනුවෙන් ගන්නා තීරණය පැහැදිලි කරගත යුතුයි.අනෙක් කරුණ පෙර තිබූ අතුරු ව්‍යවස්තාව සහ මෙම අතුරු ව්‍යාවස්ථාව අතර වෙනස පිළිබඳව විෂය නිලධාරීගෙන් පැහැදිලිකිරීමක් සිදුකරගත යුතුයි.

**සභාපතිතුමා:-**

මෙහි වැඩසටහන සඳහා ලේකම්තුමා තමයි සහභාගී වුණේ. ඒ ලබාගත් තීන්දු තීරණ අනුව තමා මෙය සකස්කර එවා තිබෙන්නේ.ඉතාමත් අඩු බිම් කොටස් සඳහා නම් විසඳුමක් ලබාදෙන එකක් නැහැ.මෙය දීර්ඝ ලෙස සාකච්ඡාකර සැදූ දෙයක් බැවින් අපට මෙය වෙනස්කල නොහැකියි.අපි ලිඛිතව කොමසාරිස්තුමාගෙන් විමසීමක් සිදුකරමු පර්චස් 1,2 සහ 3 සඳහා කුමක්ද සිදුකරන්නේ කියා.

**සභාපතිතුමා :-**

විරෝධතා තිබේනම් දැනුම්දෙන්න.

නිහඬතාවයෙන් පෙනී යන්නේ විරෝධතා කිසිවක් නොමැති බවයි.

**ඒ අනුව, ප්‍රාදේශිය සභා බල ප්‍රදේශය තුළ නිවාස හා නගර සංවර්ධන ආඥා පනත ක්‍රියාත්මක වන ප්‍රදේශයක ඉඩම් සැලසුම් ,ඉඩම් අනුබෙදුම් සැලසුම් හා ගොඩනැගිලි සැලසුම් පරීක්ෂා කිරීම ,අනුමත කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව 1897 අංක 15 දරණ ප්‍රාදේශිය සභා පනතේ 122 වගන්තිය පරිදි අනුමැතිය ලබාදීමට** ඒකමතිකව සභා සම්මත විය.

vi. **පනාවල පාර අක්කර 03 පාර සිට ප්‍රධාන පාර දෙපස ඇලවේල්ල කැපීම සඳහා මහා සභා අනුමැතිය ලබා ගැනීම -ඇස්තමේන්තු මුදල - රු.300,000.00 - ගරු සභාපතිතුමා**

**සභාපතිතුමා:-**

**පනාවල පාර අක්කර 03 පාර සිට ප්‍රධාන පාර දෙපස ඇලවේල්ල කැපීම සඳහා මහා සභා අනුමැතිය ලබා ගැනීමේ යෝජනාව -ඇස්තමේන්තු මුදල - රු.300,000.00 සභාවට යෝජනා කරනවා.**

**සභික ආර්.ධනරත්න මැතිතුමා:-**

එම යෝජනාව මම ස්ථිර කරනවා.

එම ස්ථානයේ අපද්‍රව්‍ය ගොස් සිරවීමක් සිදුව තිබෙනවා.එම අතුරු මාර්ගය ශුද්ධ කල යුතුයි. මෙම කාරණය ඉතාමත් හොඳයි.

**සභාපතිතුමා :-**

**මමත් එම ස්ථානයට ගොස් පරීක්ෂා කළා. ජලය බැස යාමක් සිදුවන්නේ නැහැ.**

**සභාපතිතුමා :-**

විරෝධතා තිබේනම් දැනුම්දෙන්න.

නිහඬතාවයෙන් පෙනී යන්නේ විරෝධතා කිසිවක් නොමැති බවයි.

**ඒ අනුව, පනාවල පාර අක්කර 03 පාර සිට ප්‍රධාන පාර දෙපස ඇලවේල්ල කැපීම සඳහා මහා සභා අනුමැතිය ලබා ගැනීම -ඇස්තමේන්තු මුදල - රු.300,000.00** සඳහා මහ සභා අනුමැතිය ලබා ගැනීමේ යෝජනාව **ඒකමතිකව සභා සම්මත විය.**

VII.

**ඇහැලියගොඩ විලේගොඩ ආදාහනාගාරයේ ගිවිසුම අවලංගුකර ගැනීම සඳහා මහා සභා අනුමැතිය ලබාගැනීම-ගරු සභාපතිතුමා**

**සභාපතිතුමා:-**

**ඇහැලියගොඩ විලේගොඩ ආදාහනාගාරයේ ගිවිසුම අවලංගුකර ගැනීම සඳහා මහා සභා අනුමැතිය ලබාගැනීමේ යෝජනාව සභාවට යෝජනා කරනවා.**

**සභික ආර්.ධනරත්න මැතිතුමා:-**

**එම යෝජනාව මම ස්ථිර කරනවා.**

**සභික ආර්.ධනරත්න මැතිතුමා:-**

අවලංගු කරන විට අපි ඔහුට තව මුදලක් ගෙවීමට තිබෙනවාද?

**සභාපතිතුමා :-**

එම කොන්ත්‍රාත්කරු කොටසක් වැඩ අවසන්කර තිබෙනවා. තව බොහෝ කොටස් ඉතිරිව තිබෙනවා. අපි ඔහුට අවසාන බිල්පත ඉදිරිපත් කිරීමට දින 14ක් ලබාදුන්විට තවත් කාලය ඉල්ලා සිටියා. එය ලබාදිය නොහැකියි. මෙම ගිවිසුම අවලංගු නොකර ඉතිරි වැඩ අපට සිදුකිරීමට බැහැ. අප ඔහුට මුදල් ලබාදෙන්නේ සිදුකල වැඩ කොටසට පමණයි. කොමසාරිස්තුමාගේ උපදෙස් අනුව තමා සභාවට මෙය ඉදිරිපත් කළේ. සිදු නොකල විෂයන් සඳහා ගෙවීමක් සිදුකරන්නේ නැහැ.

සභික ශිරාන් සමරතුංග මැතිතුමා:-

අපිට සිදුව ඇති පාඩුව සඳහා එයාලගේ රඳවුම් මුදලින් අයකර ගැනීමට වැඩපිළිවෙලක් යොදා ගමු.

**සභාපතිතුමා :-**

අයකිරීම් සිදුකිරීමේදී සිදුකල දේට පමණයි අපි ගෙවන්නේ.

සභික පී.ආරියවංශ මැතිතුමා:-

නිසි වේලාවට මෙම වැඩ කොටස් සිදු නොවූ නිසා අපි වරින්වර කාලය දීර්ඝ කළා. එසේනම් මුලින්ම කාලය දීර්ඝ නොකර සිටින්නට තිබුණා. එදින ගිවිසුම අවලංගුනොකල නිසා මිල උච්ඡාවචනයට වග කිව යුත්තේ අපි. ඔහුට නොහැකි දේ අපි සිදුකර තිබෙනවා. ඒවා අඩුකර ඔහු සිදුකල දේට මුදල් ගෙවා හැකි ඉක්මනින් ගිවිසුම අවලංගු කර ඉතිරි වැඩ සිදුකරමු.

සභික හරිස්චන්ද්‍ර කිරිඇල්ල මැතිතුමා:-

මුල සිටම අපි දන්නවා ආදාහනාගාරයේ වැඩකටයුතු සිදු වූ ආකාරය පිළිබඳව. හිටපු සභාපතිතුමා හරහා යම් කිසි අතපසු වීම් සිදු වුණා. ඒවා අපි පිළිගත යුතුයි. යම් කිසි දෙයක් සිදුව තිබේනම් ,ඒවාට අධිහාරයක් ලෙස එම මුදල් අපිට ගෙවීමට බැහැ. මෙම ගිවිසුම හැමදාම තියන් ඉන්න බැහැ. ඉක්මනින් මෙම ගිවිසුම අවසන්කර අපි ඉතිරි වැඩ කොටස සිදුකල යුතුයි. නියමිත විගණනයකින් පසු තමා මෙය සභාවට යෝජනාවක් ලෙස ඉදිරිපත් කරන්නේ. සභාවට යම් කිසි අසාධාරණයක් වෙනවා නම් මෙය ඉදිරිපත් කරන්නේ නැහැ.එසේනම් මෙම ගිවිසුම අවසන්කර ඉතිරි වැඩ අපි සිදුකරමු.එයට අපි අනුමැතිය ලබාදෙමු. අපේ විශ්වාසයක් තිබෙනවා ලේකම්තුමා,සභාපතිතුමා,විෂය නිලධාරීන් නිසියාකරව එම වගකීම් සිදුකර ඇති කියා.

සභික දිලීන් සමුදිත කරුණාපාල මැතිතුමා:-

ගිවිසුම අවලංගු වූ දින සිටද වගකීම අපිට ලැබෙන්නේ? වගකීම් සහතිකය කොපමණ කාලයකට තිබෙනවාද?

සභාපතිතුමා:-

අප්‍රේල් 15වන විට වගකීම් කාලය අවසන්. ව්‍යාපෘතිය අවසන්කර මාස තුන අවසන් වූ පසු වගකීම් කාලය අවසන්. එතෙක් රඳවුම් මුදල දෙන්නේ නැහැ.රු. 842,000.00ක ඇප තැන්පතුවක් තිබෙනවා.

සභික පී.හරිස්චන්ද්‍ර මැතිතුමා:-

විෂය නිලධාරීන් ගෙන්වා මෙම ගැටළු පිළිබඳව සාකච්ඡාවක් පවත්වමු. විෂය භාර නිළධාරියා අපිට මේ තොරතුරු ලබාදී ගිවිසුම අවසන් කළ හැකි තත්වයක් තිබෙන බව පවසා තිබෙනවා . ඒ බව අපි විෂය නිලධාරී ගෙන්වා තහවුරු කරගමු. නොමැතිනම් අධිහාරයක් සිදු වේවි.

සභාපතිතුමා:-

කිසිසේත්ම අධිහාර වීමක් සිදුවන්නේ නැහැ.ඔබතුමන්ලා වෙනුවෙන් මම සම්පූර්ණ වගකීම භාරගන්නවා. මෙම වැඩසටහන සිදුකර යාමේදී ප්‍රමාද වීමට හේතු ගණනාවක් තිබෙනවා. හිටපු සභාපතිතුමා අද වන විට ජීවතුන් අතරත් නොමැති නිසා සිදු වූ දේවල් පිළිබඳ කතාකර තේරුමක් නැහැ. මම ඒ නිසා ඔබතුමන්ලා වෙනුවෙන් සම්පූර්ණ වගකීම භාරගන්නවා. සිදුකිරීමට ඇති වැඩ කටයුතු අපි නිවැරදිව සිදු කරමු.සිදුකර ඇති වැඩ විෂයන් හැරුණු විට කිසිසේත්ම වැඩිපුර මුදලක් ගෙවන්නේ නැහැ.

සභික පී.හරිස්චන්ද්‍ර මැතිතුමා:-

ඔබතුමා ඇතුළු නිලධාරීන් පිළිබඳ අවිශ්වාසයක් නැහැ. එසේනම් ඉදිරියට වැඩකටයුතු සිදුකරගෙන යමු.

**සභාපතිතුමා :-**

අපි මේ සියලු ගෙවීම් කටයුතු සිදුකිරීමට පෙර පළාත් ප්‍රධාන ඉංජිනේරුතුමා වෙත යොමු කරනවා,නර්ඩ් ආයතනය වෙත යොමු කරනවා,කොමසාරිස්තුමාට යොමුකරනවා. එම අනුමැතියන් ලද පසු තමා ගෙවීම් කටයුතු සිදුකරන්නේ.

**සභාපතිතුමා :-**

විරෝධතා තිබේනම් දැනුම්දෙන්න.

නිහඬතාවයෙන් පෙනී යන්නේ විරෝධතා කිසිවක් නොමැති බවයි.

**ඒ අනුව, ඇහැලියගොඩ විලේගොඩ ආදාහනාගාරයේ ගිවිසුම අවලංගුකර ගැනීම සඳහා මහා සභා අනුමැතිය ලබාගැනීමේ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.**

**සභාපතිතුමා :-**

නගරයේ බස් රථ පොළ භූමියට රැගෙන යාම පිළිබඳව ඇතිවූ ගැටළුව පිළිබඳව සාකච්ඡා කිරීමට මේ අවස්ථාවේදී බස් රථ හිමියන් මහා සභාවට පැමිණ සිටිනවා. ඒ පිළිබඳව සාකච්ඡා කිරීම සඳහා මහා සභාව කාරක සභාවක් ලෙස මම යෝජනා කරනවා.

**සභික සුජීව විජේසූරිය මැතිතුමා:-**

එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ඒ අනුව මහා සභාව කාරක සභාවක් බවට පත්විය.**

**සභාපතිතුමා :-**

කාරක සභාව මහ සභාවක් බවට පත්කිරීමට යෝජනා කරනවා.

**සභික රසිකා වසන්ති සිරිවර්ධන මැතිනිය:-**

එම යෝජනාව මම ස්ථිර කරනවා.

ඒ අනුව බස් නැවතුම්පල එක් ස්ථානයක තිබිය යුතු බව බස් රථ හිමියන්ද පිළිගන්නා ලදී. එහිදී බස් රථ හිමියන්ට සිදුවන අපහසුතාවය අවම වන ලෙස මෙම වැඩපිළිවෙළ ඉදිරියට සිදුකරගෙන යාමටත්, කාලය පිළිබඳ ගැටළුව මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියත් සමඟ සාකච්ඡා කිරීමටත්, එතෙක් පෙරහුරුවක් ලෙස සතියක කාලයක් එම බස් රථ පොළ භූමියෙන්ම ආරම්භ කිරීමටත් තීරණය විය.

**viii. 2021 හා 2022 වර්ෂයන්හිදී කාර්යාල කටයුතු පවත්වාගෙන යාම සඳහා සහ ප්‍රවාහන පහසුකම් සලසාගැනීම සඳහා සභාවේ PF-7135 හා PF-6729 දරන කැබ්රථ යොදවා ගැනීම වෙනුවෙන් මහා සභා අනුමැතිය ලබාගැනීම- ගරු සභාපතිතුමා**

**සභාපතිතුමා:-**

**2021 හා 2022 වර්ෂයන්හිදී කාර්යාල කටයුතු පවත්වාගෙන යාම සඳහා සහ ප්‍රවාහන පහසුකම් සලසාගැනීම සඳහා සභාවේ PF-7135 හා PF-6729 දරන කැබ්රථ යොදවා ගැනීම වෙනුවෙන් මහා සභා අනුමැතිය ලබා ගැනීමේ යෝජනාව** සභාවට යෝජනා කරනවා.

**සභික සුජීව විජේසූරිය මැතිතුමා:-**

**එම යෝජනාව මම ස්ථිර කරනවා.**

**ප්‍රමාද වී හෝ මෙම යෝජනාව ගෙන ඒම පිළිබඳව හදපිරි ප්‍රණාමය පළකර සිටිනවා.එම අවුරුදු දෙක තුන තුළ සභාවේ නිලධාරීන් බොහොම අපහසුතාවයට පත්ව එම රාජකාරි ඉටු කළේ. ගරු බැසිල් රාජපක්ෂ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් එම කොරෝනා වසංගත කාලය තුළ ඈත දිස්ත්‍රික්ක වලින්ද නිලධාරීන්ද පැමිණ රාජකාරි ඉටු කිරීමේ දී අපේ වාහන භාවිතා කළා. සියලුම දේ සිදු කළේ බල ප්‍රදේශයේ ජනතාගේ සුභ සිද්ධිය වෙනුවෙන්. සමහර වෙලාවට උදේ 8ට කියනවා 10ට රැස්වීමට එන්න කියලා.**

**සභික ආර්.ධනරත්න මැතිතුමා:-**

**එකල අපේ ගරු සභාපතිතුමත් අසනීපෙන් සිටියා. දුර ප්‍රදේශවල සිටි නිලධාරීන්ට පැමිණීමට අපහසුතා තිබුණා. ඔවුන්ට පැමිණීමට වාහනයක් ලබා දුන්නා නම් එය සාධාරණයි. අසනීප තියාගෙනත් ඔවුන් පැමිණ රාජකාරි ඉටු කළා.**

**සභාපතිතුමා:-**

**මෙහිදී ලේකම්තුමාට පමණක් නොවෙයි සියලුම නිලධාරීන්ට ගමන් පහසුකම් ඒ කාලයේදී ලබාදීමට සිදු වුණා.හිටපු ගරු සභාපතිතුමා අසනීප නිසා මා හටත් බොහෝ රාජකාරි කටයුතු වලදී මැදිහත් වීමට සිදුවුණා. එන්නත් කිරීමේ සායන ගමක් ගමක් පාසා සිදුකිරීමට සිදු වුණා. වියළි ආහාර බෙදා දීමද සිදුකෙරුණා. මෙහිදී එම නිලධාරී සෑම දෙනාම අපේ වාහන දෙකෙන් තමයි ප්‍රභාහනය සිදු කළේ.සෞඛ්‍ය නිලධාරීන්ටත් ගමන් පහසුකම් ලබාදීමට සිදු වුණා. දිනපතා එම පහසුකම් ලබාදීමට සිදු වූ අවස්ථාත් තිබුණා.ඒ නිසා මෙය කාලෝචිත යෝජනාවක් .සභාය දැක්වීම පිළිබඳව ස්තුතිවන්ත වෙනවා.**

**සභාපතිතුමා :-**

විරෝධතා තිබේනම් දැනුම්දෙන්න.
නිහඬතාවයෙන් පෙනී යන්නේ විරෝධතා කිසිවක් නොමැති බවයි.

**ඒ අනුව, 2021 හා 2022 වර්ෂයන්හිදී උද්ගත වූ කොරෝනා වසංගතය,ඉන්ධන අර්බුදය හා ව්‍යසනකාරී තත්වයන් හේතුවෙන් පොදු ප්‍රවාහන සේවා ඇණහිට තිබීමත් හා අත්‍යවශ්‍ය සේවා කර තිබූ පළාත් පාලන ආයතන පවත්වාගෙන යාමටත් ,අත්‍යවශ්‍ය නිලධාරීන් සභාවට ගෙන්වා ගැනීමටත් හා එමගින් කසළ කළමනාකරණය ,විෂබීජහරණය,කමිටු හා මහසභා රැස්වීම් පවත්වාගෙන යාමටත් ,මහජන ඉල්ලීම් ඉටුකිරීම සඳහා සහ පැරණි ප්‍රශ්නගත ලිපිගොනු නිරීක්ෂණය සඳහා ගෙනයාමටත් සභාවේ ලේකම්වරයාට කාර්යාලයට පැමිණීමට හා ආපසු යාමට සභාව සතු PF-7135 හා PF-6729 දරන කැබ්රථ යොදවා ගැනීමේ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.**

**IX. 2022-12-13 දින පැවති මහා සභා රැස්වීමේදී යථා පරිදි කල් දී ඇති යෝජනා යටතේ ගත් අංක 5(xvii) තීරණය සංශෝධනය කිරීම -ගනේගොඩ ගම මැද පාර ජනක මහතාගේ නිවස අසල පාර කොන්ක්‍රීට් කිරීම සඳහා මහා සභා අනුමැතිය ලබාගැනීමේ යෝජනාව සඳහා මහා සභා අනුමැතිය ලබා ගැනීම -ඇස්තමේන්තුගත මුදල රු.468,297.04 - ගරු සභාපතිතුමා**

**සභාපතිතුමා :-**

**2022-12-13 දින පැවති මහා සභා රැස්වීමේදී යථා පරිදි කල් දී ඇති යෝජනා යටතේ ගත් අංක 5(xvii) තීරණය සංශෝධනය කිරීම -ගනේගොඩ ගම මැද පාර ජනක මහතාගේ නිවස අසල පාර කොන්ක්‍රීට් කිරීම සඳහා මහා සභා අනුමැතිය ලබාගැනීමේ යෝජනාව සඳහා මහා සභා අනුමැතිය ලබා ගැනීම -ඇස්තමේන්තුගත මුදල රු.468,297.04 සඳහා වන යෝජනාව** සභාවට යෝජනා කරනවා.

**සභික එච්.ටී.තිලකරත්න මැතිතුමා**
එම යෝජනාව මම ස්ථිර කරනවා.

**සභාපතිතුමා :-**
විරෝධතා තිබේනම් දැනුම්දෙන්න.
නිහඬතාවයෙන් පෙනී යන්නේ විරෝධතා කිසිවක් නොමැති බවයි.

**ඒ අනුව, 2022-12-13 දින පැවති මහා සභා රැස්වීමේදී යථා පරිදි කල් දී ඇති යෝජනා යටතේ ගත් අංක 5(xvii) තීරණය සංශෝධනය කිරීම -ගනේගොඩ ගම මැද පාර ජනක මහතාගේ නිවස අසල පාර කොන්ක්‍රීට් කිරීම සඳහා මහා සභා අනුමැතිය ලබාගැනීමේ යෝජනාව සඳහා මහා සභා අනුමැතිය ලබා ගැනීම සඳහා වන යෝජනාව -ඇස්තමේන්තුගත මුදල රු.468,297.04 ඒකමතිකව සභා සම්මත විය.**

**X. විජේනායක මාවතෙහි බෝගහවත්ත නිවාස සංකීර්ණයට පිවිසෙන මාර්ගය බෝගහවත්ත මාවත ලෙස නම් කිරීම සම්බන්ධ යෝජනාව සඳහා මහා සභා අනුමැතිය ලබාගැනීම - ගරු සභාපතිතුමා**

**සභාපතිතුමා :-**

**විජේනායක මාවතෙහි බෝගහවත්ත නිවාස සංකීර්ණයට පිවිසෙන මාර්ගය බෝගහවත්ත මාවත ලෙස නම් කිරීම සම්බන්ධ යෝජනාව සඳහා මහා සභා අනුමැතිය ලබාගැනීම සඳහා වන යෝජනාව** සභාවට යෝජනා කරනවා.

**සභික ආර්.ධනරත්න මැතිතුමා**
එම යෝජනාව මම ස්ථිර කරනවා.
**සභාපතිතුමා :-**
විරෝධතා තිබේනම් දැනුම්දෙන්න.
නිහඬතාවයෙන් පෙනී යන්නේ විරෝධතා කිසිවක් නොමැති බවයි.

**ඒ අනුව, විජේනායක මාවතෙහි බෝගහවත්ත නිවාස සංකීර්ණයට පිවිසෙන මාර්ගය බෝගහවත්ත මාවත ලෙස නම් කිරීම සම්බන්ධ යෝජනාව සඳහා මහා සභා අනුමැතිය ලබාගැනීම සඳහා වන යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.**

**XI. ඇහැලියගොඩ බල ප්‍රදේශයේ නිවාසයන්හි ඉඩ පහසුකම් නොමැති අය සඳහා අවමංගල්‍ය කටයුතු පහසුවෙන් සිදුකර ගැනීම සඳහා අවශ්‍ය ආකාරයේ ක්‍රමවත් ශාලාවක් ඉදිකිරීමට කටයුතු සිදුකිරීම සඳහා මහා සභා අනුමැතිය ලබාගැනීම - ආර්.ධනරත්න මැතිතුමා**

**සභාපතිතුමා :-**

**ඇහැලියගොඩ බල ප්‍රදේශයේ නිවාසයන්හි ඉඩ පහසුකම් නොමැති අය සඳහා අවමංගල්‍ය කටයුතු පහසුවෙන් සිදුකර ගැනීම සඳහා අවශ්‍ය ආකාරයේ ක්‍රමවත් ශාලාවක් ඉදිකිරීමට කටයුතු සිදුකිරීම සඳහා මහා සභා අනුමැතිය ලබාගැනීම සඳහා වන යෝජනාව** සභාවට යෝජනා කරනවා.

**සභික එච්.ටී.තිලකරත්න මැතිතුමා**

එම යෝජනාව මම ස්ථිර කරනවා.

කාලෝචිත යෝජනාවක්.

**සභික ආර්.ධනරත්න මැතිතුමා**

මම මෙම යෝජනාව ඉදිරිපත් කළේ යම් අපහසුතාවන් තිබෙන නිවාසවල අය වෙනුවෙන් එම භූමියේ දේහය තබා ඥාතීන්ට අවසන් ගරු බුහුමන් දැක්වීමට අවස්ථාව සලසා දීමට. සමහර මල් ශාලා වලත් එම අවස්ථාව ලබාදී තිබෙනවා.නමුත් විශාල මුදලක් වැය වෙනවා. අපි විසින් යම් සාධාරණ මුදලකට ආදාහනාගාරය ආසන්නව පාර අසල ඉදිකරනවා නම් වඩාත් හොඳයි.එම නිසා එම පහසුකම ජනතාවට ලබාදෙන ලෙස ඉල්ලා සිටිනවා.

සභාපතිතුමා:-

ආදාහනාගාරය පිහිටි භූමියේම ඉදිකිරීම ප්‍රදේශයේ ජනතාවට වඩාත් හොඳයි.ඉදිරියේදී සාකච්ඡාකර තීරණයක් ලබා ගනිමු.

**සභාපතිතුමා :-**

විරෝධතා තිබේනම් දැනුම්දෙන්න.

නිහඬතාවයෙන් පෙනී යන්නේ විරෝධතා කිසිවක් නොමැති බවයි.

**ඒ අනුව, ඇහැලියගොඩ බල ප්‍රදේශයේ නිවාසයන්හි ඉඩ පහසුකම් නොමැති අය සඳහා අවමංගල්‍ය කටයුතු පහසුවෙන් සිදුකර ගැනීම සඳහා අවශ්‍ය ආකාරයේ ක්‍රමවත් ශාලාවක් ඉදිකිරීමට කටයුතු සිදුකිරීම සඳහා මහා සභා අනුමැතිය ලබාගැනීම සඳහා වන යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.**

**XII. ඇහැලියගොඩ ප්‍රාදේශිය සභාවට අයත් තොරණගොඩ අංගනයේ ගාල් කර ඇති වාහන සම්බන්ධව 2023-02-27 දින පරීක්ෂා කිරීමෙන් පසු ලබාගත් තීරණ සඳහා මහා සභා අනුමැතිය ලබා ගැනීම - ගරු සභාපතිතුමා**

**සභාපතිතුමා :-**

**ඇහැලියගොඩ ප්‍රාදේශිය සභාවට අයත් තොරණගොඩ අංගනයේ ගාල් කර ඇති වාහන සම්බන්ධව 2023-02-27 දින පරීක්ෂා කිරීමෙන් පසු ලබාගත් තීරණ සඳහා මහා සභා අනුමැතිය ලබා ගැනීම සඳහා වන යෝජනාව** සභාවට යෝජනා කරනවා.

**සභික හරිස්චන්ද්‍ර කිරිඇල්ල මැතිතුමා:-**

එම යෝජනාව මම ස්ථිර කරනවා.

**සභාපතිතුමා :-**

විරෝධතා තිබේනම් දැනුම්දෙන්න.

නිහඬතාවයෙන් පෙනී යන්නේ විරෝධතා කිසිවක් නොමැති බවයි.

**ඒ අනුව, ඇහැලියගොඩ ප්‍රාදේශිය සභාවට අයත් තොරණගොඩ අංගනයේ ගාල් කර ඇති වාහන සම්බන්ධව 2023-02-27 දින පරීක්ෂා කිරීමෙන් පසු ලබාගත් තීරණ සඳහා මහා සභා අනුමැතිය ලබා ගැනීම සඳහා වන යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.**

**XIII. ඇහැලියගොඩ මූලික රෝහලේ වාට්ටු ආසන්නයේ පවතින වලක් ගොඩ වී දුගඳ හමන බැවින් ඒ සඳහා වලක් කපා ගැනීමටත් ,ගේට්ටු කුළුණු සකස්කර ගැනීමට වලවල් දෙකක් කපා ගැනීමටත් ,බැකෝ යන්ත්‍රයක් අවශ්‍ය වී ඇති බැවින් ඒ සඳහා සභාව සතු බැකෝ යන්ත්‍රය ලබා දීම සඳහා මහා සභා අනුමැතිය ලබාගැනීම - ගරු සභාපතිතුමා**

**සභාපතිතුමා :-**

**ඇහැලියගොඩ මූලික රෝහලේ වාට්ටු ආසන්නයේ පවතින වලක් ගොඩ වී දුගඳ හමන බැවින් ඒ සඳහා වලක් කපා ගැනීමටත් ,ගේට්ටු කුළුණු සකස්කර ගැනීමට වලවල් දෙකක් කපා ගැනීමටත් ,බැකෝ යන්ත්‍රයක් අවශ්‍ය වී ඇති බැවින් ඒ සඳහා සභාව සතු බැකෝ යන්ත්‍රය ලබා දීම සඳහා මහා සභා අනුමැතිය ලබාගැනීම සඳහා වන යෝජනාව** සභාවට යෝජනා කරනවා.

**සභික එච්.ටී.තිලකරත්න මැතිතුමා**

එම යෝජනාව මම ස්ථිර කරනවා.

සභික දිලීන් සමුදිත කරුණාපාල මැතිතුමා:-

එම යෝජනාවත් හොඳයි. එමෙන්ම වානක මන්ත්‍රීතුමා හැමදාම කතා කළා ජානිස් මාවත පුළුල් කර ගැනීම පිළිබඳව. ගරු ඇමතිතුමියත් පොරොන්දුවක් ලබාදුන්නා. ඒ සඳහා නිලධාරී මට්ටමේ සාකච්ඡාවක් පැවැත්වීමට සුදුසු වාතාවරණයක් සකසා දෙන ලෙස ඉල්ලා සිටිනවා.

**සභික හරිස්චන්ද්‍ර කිරිඇල්ල මැතිතුමා:-**

මුදල් වෙන් කිරීමේදී යම් කිසි ගැටළුවක් තිබෙනවාද?

**සභාපතිතුමා :-**

නැහැ. එහෙන් ගෙවීම් කරනවා නම් ලබාදිය හැකියි. නමුත් ඒ අය ඉල්ලා සිටින්නේ නොමිලේ. එම නිසා ඒ අය ලිපියක් එවා තිබෙනවා මහා සභා අනුමැතිය ලබා ගැනීමට. අපි මෙය ආණ්ඩුකාරතුමාගේ අනුමැතියට යටත්ව නීත්‍යානුකූලව කටයුතු කරනවා. ආණ්ඩුකාරතුමා කියා සිටියහොත් ලබාදෙන්න එපා කියලා අපි දෙන්නේ නැහැ.

**සභාපතිතුමා :-**

විරෝධතා තිබෙනම් දැනුම්දෙන්න.

නිහඬතාවයෙන් පෙනී යන්නේ විරෝධතා කිසිවක් නොමැති බවයි.

**ඒ අනුව, ඇහැලියගොඩ මූලික රෝහලේ වාට්ටු ආසන්නයේ පවතින වලක් ගොඩ වී දුගඳ හමන බැවින් ඒ සඳහා වලක් කපා ගැනීමටත් ,ශෞචාලය කුළුණු සකස්කර ගැනීමට වලවල් දෙකක් කපා ගැනීමටත් ,බැකෝ යන්ත්‍රයක් අවශ්‍ය වී ඇති බැවින් ඒ සඳහා සභාව සතු බැකෝ යන්ත්‍රය ලබා දීම සඳහා මහා සභා අනුමැතිය ලබාගැනීම සඳහා වන යෝජනාව,** ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය පරිදි සිදුකිරීමට **ඒකමතිකව සභා සම්මත විය.**

**XIV. 15/4/22/ඇහැලි/35 අංක හා 2023-03-01 දිනැතිව දිස්ත්‍රික් ඉඩම් ප්‍රතිසංස්කරණ බලමණ්ඩලය ,කලාප සහකාර අධ්‍යක්ෂ (රා.ආ.) විසින් යොමුකර ඇති ලිපියෙහි සඳහන් පරිදි 143- උතුරු කරඳන ග්‍රාම නිලධාරී වසමේ පිහිටි කෝමාරිකාගල වත්ත ඉඩමෙහි සුසාන භූමිය ලෙස භාවිතා කරනු ලබන බිම් කොටසෙහි දකුණු මායිමේ ඉදිකරන ලද තාවකාලික නිවසෙහි පදිංචි අනවසර පදිංචිකරුවන් ඉවත්කර සුසාන භූමිය සහිත ඉඩම් කොටස ප්‍රාදේශීය සභාව වෙත පවරා ගැනීම සඳහා මහා සභා අනුමැතිය ලබා ගැනීම - ගරු සභාපතිතුමා**

**සභාපතිතුමා :-**

**15/4/22/ඇහැලි/35 අංක හා 2023-03-01 දිනැතිව දිස්ත්‍රික් ඉඩම් ප්‍රතිසංස්කරණ බලමණ්ඩලය ,කලාප සහකාර අධ්‍යක්ෂ (රා.ආ.) විසින් යොමුකර ඇති ලිපියෙහි සඳහන් පරිදි 143- උතුරු කරඳන ග්‍රාම නිලධාරී වසමේ පිහිටි කෝමාරිකාගල වත්ත ඉඩමෙහි සුසාන භූමිය ලෙස භාවිතා කරනු ලබන බිම් කොටසෙහි දකුණු මායිමේ ඉදිකරන ලද තාවකාලික නිවසෙහි පදිංචි අනවසර පදිංචිකරුවන් ඉවත්කර සුසාන භූමිය සහිත ඉඩම් කොටස ප්‍රාදේශීය සභාව වෙත පවරා ගැනීම සඳහා මහා සභා අනුමැතිය ලබා ගැනීම සඳහා වන යෝජනාව** සභාවට යෝජනා කරනවා.

සභික සුජීව විජේසූරිය මැතිතුමා:-

එම ඉඩම් කොටස ප්‍රාදේශීය සභාවට පවරාගෙන **පසුව ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව දැනුවත්කර වෙනත් ස්ථානයකින් බිම් කොටසක් ලබාදීමටත් එම යෝජනාව මම ස්ථිර කරනවා.**

**සභාපතිතුමා :-**

ගමේ ජනතාවගෙන් LRC එකට ලිපියක් යොමුකර තිබෙනවා. ඒ අනුව තමයි LRC එකෙන් අපිට ලිපියක් එවා තිබෙන්නේ.

සභික ශිරාන් සමරතුංග මැතිතුමා:-

මෙම යෝජනාව අසාධාරණ යෝජනාවක්. එම සුසාන භූමියට වෙන්කල ස්ථානයේ රාජ්‍ය ආයතනකුත් ඉදිකර තිබෙනවා. සේවා පියස ඉදිකර තිබෙන්නෙත් එහි.රාජ්‍ය ආයතන ඉදිකර එම මිනිසුන් පමණක් ඉවත් කිරීම අසාධාරණයි.

**සභාපතිතුමා :-**

ප්‍රාදේශීය සභාවට තවම පවරා නැහැ. අයිතිය තිබෙන්නේ LRC එකට.

**සභික අනුර ගාමිණී හෙට්ටිආරච්චි මැතිතුමා:-**

අප මෙයට මැදිහත් විය යුතු නැහැ.

**සභික සුජීව විජේසූරිය මැතිතුමා:-**

රාජ්‍ය ආයතනවලට වෙන්වී ඇති සේම අහිංසක පවුල් පදිංචි වී සිටින බැවින් එම පවුලටත් පර්.15ක් ලබාදෙමු.

**සභික ආර්.ධනරත්න මැතිතුමා:-**

රජයේ ඉඩම් වලට දෙනවා වගේම එම අහිංසක පවුලටත් ලබාදිය යුතුයි.

**සභික හරිස්චන්ද්‍ර කිරිඇල්ල මැතිතුමා:-**

මෙම ගැටළු මම හොඳින දන්නා කරුණක්. මෙය LRC ඉඩමක්. ප්‍රදේශයේ සියළුම ජනතාව මෙයට විරුද්ධයි. ඔවුන් ඉල්ලා සිටින්නේ මෙම පවුල ඉවත්කර දෙන ලෙස. එම පවුල තේ වගාවකුත් එහි සිදුකර

තිබෙනවා.ජනතාව ඉල්ලා සිටින්නේ සුසාන භූමිය වටා කම්බි ගසා දෙන ලෙස. මෙය අපේ අයිතිය. මෙලෙස සිදු වුවහොත් ප්‍රදේශයේ අනිකුත් සුසාන භූමි වලටත් මේ දෙයම සිදුවේවි. අක්කර ½ක පමණ තේ වගාවක් තිබෙනවා. පර්චස් 10ක් ලබාදීමේදී එම වගාව ඉවත් කිරීමට ඔවුන් කැමති වේවිද?

**සභාපතිතුමා:-**

අපෙන් ඉල්ලා තිබෙන කාරණය අපි අනුමැතිය දෙමු. පසුව වෙනත් ස්ථානයකින් බිම් කොටසක් අපි ලබාදෙමු.

**සභික ශිරාන් සමරතුංග මැතිතුමා:-**

එතුමා අත්තිවාරමකුත් දාලා තිබෙන්නේ. එම නිවසේ හමුදා සේවයේ නියුතු දරුවෙක් සිටිනවා. ඔහු තමා නිවසේ ඉදිකිරීම් සිදුකරගෙන යනු ලබන්නේ. පියා අතීතයේ කසිප්පු ව්‍යාපාරයේ නියැලී තිබෙනවා.මෙහි මානුෂීය ප්‍රශ්නයකුත් තිබෙනවා.

**සභික ආර්.ධනරත්න මැතිතුමා:-**

LRC එකෙනුත් යම් අඩුපාඩු සිදු වෙනවා. අවුරුදු 32ක් ගතවන තෙක් කුමක්ද සිදු කළේ. එලෙස අසාධාරණයක් සිදුකරන්න දෙන්න එපා.

**සභික සුජීව විජේසූරිය මැතිතුමා:-**

තාත්තා හෝ අම්මා හෝ කසිප්පු විකුණූ හේතුවට දරුවනුත් එම ව්‍යාපාරයම සිදුකල යුතු නැහැ.ඔවුන් එම හේතුව නිසාම ඉවත් කල යුතුත් නැහැ. ඔවුන්ට යම් කිසි සාධාරණයක් විය යුතුයි.

**සභාපතිතුමා:-**

අපි එම පවුල වෙනුවෙන් සාධාරණයක් සිදුකිරීමටත් සුසාන භූමිය සහිත ඉඩම ප්‍රාදේශිය සභාවට පවරා ගැනීමටත් කටයුතු කරමු.

**සභික දිලීන් සමුදිත කරුණාපාල මැතිතුමා:-**

LRC එකේ ඉඩම් කච්චේරිය මගින් මෙය විසඳාගත යුතුයි. මෙම යෝජනාව සභාවට දැමීමෙන් ඵලක් නැහැ. LRC එකෙන් තීරණය කරාවි ඔවුන්ට ලබාදෙන ඉඩම් ප්‍රමාණය පිළබඳව .ඉන්පසු අපි තීරණය කරමු සුසාන භූමිය සභාවට පවරා ගැනීමට. මෙය වැරදි පූර්වාදර්ශයක් වීමට ඉඩ ලබා නොදී LRC එකටම තීරණය කිරීමට ඉඩ ලබාදෙමු ඔවුන්ට ඇති හිමිකම් ලබාදීමට. මේ යෝජනාව ස්ථිර කිරීමට මෙම තොරතුරු ප්‍රමාණවත් නැහැ. නොමැතිනම් ප්‍රජා සංවර්ධන කමිටුවට යොමුකර එම වාර්තාව ලබාගෙන තීරණයක් ගනිමු.මගේ නම් අදහස මම මෙයට එකඟ නැහැ.

**සභාපතිතුමා:-**

ඔවුන් අසා තිබෙන්නේ සුසාන භූමිය සහිත බිම් කොටස ප්‍රාදේශිය සභාවට පවරා ගැනීමට එකඟත්වය. එම නිසා අපි එකඟත්වය ලබාදෙමු.

**සභික හරිස්චන්ද්‍ර කිරිඇල්ල මැතිතුමා:-**

මුළු ගමක්ම මෙයට විරුද්ධ වන හේතුව අපි සොයා බැලිය යුතුයි.ගමේ සමිතිවල අත්සනත් මෙහි තිබෙනවා. එසේනම් අපි මෙයට දැන් අනුමැතිය ලබා නොදී නිරීක්ෂණ චාරිකාවක් ගොස් එම පුද්ගලයින් හමු වී ,ප්‍රාදේශිය ලේකම් කාර්යාලයත් සමඟ සාකච්ඡාකර අවසර ලබා දෙනවා නම් හොඳයි.ශිරාන් මන්ත්‍රීතුමා ඇතුළු මන්ත්‍රීතුමන්ලා කිහිප දෙනෙක්ම මොවුන්ට පර්චස් 10ක් හෝ ලබාදිය යුතු බවත් පවසනවා.තව කණ්ඩායමක් කියනවා නැහැ මෙය අනවසර ඉදිකිරීමක් කියලා.LRC ඉඩම්වල රාජ්‍ය ආයතන ඉදිකිරීම සාමාන්‍ය දෙයක්.ඒවා අනුමැතිය ලබාගෙන සිදුකරන්නේ.එම නිසා රාජ්‍ය ආයතන ඉදිකිරීම හා අනවසර පදිංචිය යන කාරණය එකක් සේ සැලකිය යුතු නැහැ.මෙය කරුණු දෙකක්.මොවුන්ට පර්චස් 10ක් 15ක් දෙනවාය කිව්වාට මොවුන් එය පමණක් ලබාගන්නේ නැහැ. ඔවුන් ඉල්ලා සිටින්නේ තේ ඉඩමත් සමඟමයි.එම නිසා මම මෙයට විරුද්ධයි. මෙය ප්‍රාදේශිය සභාව සතු භූමියක්.

**සභාපතිතුමා:-**

පොදු කටයුතු සඳහා වෙන්කර ඇති භූමියක සුසාන භූමිය හෝ වෙනත් පොදු කාරණා සඳහා රාජ්‍ය ආයතන ඉදිකිරීමේ හැකියාවක් තිබෙනවා.වෙනත් ස්ථානයකින් ඉඩම් කොටසක් ඔහුට ලබාදෙමු.ඔහුට සාධාරණයක් අපි වෙනම සිදුකරමු.ඒ වෙනුවෙන් අපි මැදිහත් වෙමු.සුසාන භූමිය සහිත බිම් කොටස සභාවට පවරා ගනිමු.

**සභික ශිරාන් සමරතුංග මැතිතුමා:-**

මෙම ඉඩම වෙන් කළේ පොදු කටයුතු සඳහා නොවෙයි. සුසාන භූමිය සඳහා. එම සුසාන භූමියේ තමයි රාජ්‍ය ආයතන සියල්ල ඉදිකළේ. එම නිසා නීති දෙකක් තිබීමට බැහැ.

**සභික අශෝක ගුණරත්න මැතිතුමා:-**

සුසාන භූමි ආඥා පනත යටතේ සම්පූර්ණයෙන්ම සුසාන භූමි පවත්වාගෙන යාම ,ආරක්ෂා කිරීම සභාව සතු පරම යුතුකමක්.ඒ මත පදනම්ව කටයුතු සිදුකරන්න. දුප්පත් මිනිසුන්ද ,පොදු කටයුතු සඳහා යොදාගන්නා යන්න නොවෙයි වැදගත්.සුසාන භූමි සම්බන්ධව දිගින් දිගටම කතා කළ අයෙක් මම. විලේගොඩ සුසාන භූමියේ ක්‍රීඩාපිටිය හැදුවා,වියලගොඩ සුසාන භූමියේ පන්සලක් හැදුවා,දිවුරුම්පිටිය සුසාන භූමියේ පන්සලක් හැදුවා,මීටිපොළ සුසාන භූමියේ අහිංසක මිනිසෙක් නිවසක් හැදුවා. මේ සියල්ල හොඳ නැද්ද? හොඳයි.සුසාන භූමි සියල්ල අපිට නැති වී තිබෙන්නේ .අපිට අයිති පොදු ළිං දැන් කෝ. මාහර පාරේ ලී මෝල ඉදිරිපිට පොදු ළිඳ පිළිබඳව මම කොතෙකුත් කථා කළාද.නමුත් මැරුණු මිනිසුන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට ජීවත්ව සිටින මිනිසුන්ට නොවෙයි ආයතනයකට පවරා තිබෙන්නේ මක් නිසාද ඔවුන් වෙනුවෙන් කිසිවෙක් ඉදිරිපත් නොවන නිසා. ඕනෑම අවස්ථාවක පරීක්ෂා කර බලන්න මෙම ඇහැලියගොඩ ප්‍රාදේශිය සභාවේ සියලුම සුසාන භූමි සියල්ල අත්පත්කරගෙන ඇති.මම දිගින් දිගටම ඉල්ලීම් ඉදිරිපත් කළා මෙම සුසාන භූමි මිනිසුන්ට අල්ලා ගැනීමට ලබා නොදෙන ලෙස.ඔවුන්ට LRC එකෙන් හෝ යම් කිසි ස්ථානයකින් ඉඩම් ලබාදිය හැකියි.නමුත් මෙම සුසාන භූමි වල පදිංචි වීම පූර්වාදර්ශයක් කර ගැනීමට දෙන්න එපා.

**සභික මනෝරි සේනාධීර මැතිනිය:-**

දිවුරුම්පිටිය සුසාන භූමිය සම්බන්ධව නඩුවකුත් දැම්මා. එහි මෙහෙනින් වහන්සේ නමක් ගොඩනැගිල්ලක් ඉදිකළා. දැන් එහි හාමුදුරු නමක් සිටිනවා. ගමේ මිනිස්සුත් එහි කොටසක් අල්ලාගෙන සුසාන භූමිය නැතිකරන්නමයි හදන්නේ. LRC එකෙන් තමා සුසාන භූමිය සඳහා මෙම ඉඩම් කොටස වෙන් කළේ. මටත් මඩ ගැසුවා. මටනම් ඒවා ගැටළුවක් නොවෙයි. ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාවේම තිබෙන සුසාන භූමි මෙලෙස අල්ලා ගැනීම ගැටළුවක්නේ.

**සභාපතිතුමා:-**

LRC එකෙන් එම ස්වාමීන් වහන්සේ ඉල්ලීමක් සිදුකර තිබෙනවා ඒම අවශ්‍ය බිම් කොටස වෙන්කර දෙන ලෙසට. පසුව LRC එකෙන් අපිට ලිපියක් යොමුකර තිබෙනවා .අපි තවම පිළිතුරක් යැවුවේ නැහැ. මක් නිසාද එම ස්ථානය දිගින් දිගටම ගැටළු ඇතිවූ ස්ථානයක්. ගමේ මිනිසුන් විවිධ අවස්ථාවන් වලදී දෙකට බෙදී ගැටුම් සිදු වුණා. එහිදී අති ගෞරවනීය නාරද ස්වාමීන් වහන්සේත් අපහසුතාවයට පත්වන ලෙස ගම්වාසීන් හැසිරුණා. දැනට සිටින ස්වාමීන් වහන්සේ බලහත්කාරයෙන් පදිංචිව සිටිනවා කියලා තමා කියන්නේ. ප්‍රාදේශිය ලේකම්තුමාත් දැනුවත්කර තිබෙනවා උන්වහන්සේට එම ස්ථානයෙන් ඉවත්වන ලෙසට.එම නිසා එවැනි තත්වයක් තුළ සුසාන භූමිය ආරක්ෂාකරගත යුතු නිසාම මමත් ලේකම්තුමාත් එම ස්ථානය ස්ථානීය පරීක්ෂණයක් සිදුකර අපේ සුසාන භූමිය නිදහස්කර ගැනීමට තමා අපි බලාපොරොත්තු වන්නේ.

**සභික මනෝරි සේනාධීර මැතිනිය:-**

LRC එකේ දැනට සිටින සභාපතිතුමා පවසා සිටියේ ප්‍රාදේශිය ලේකම් කාර්යාලයෙන් සහ ප්‍රාදේශිය සභාවෙන් ලබාගත් තීරණය ඔහුට ලැබීමට සලස්වන ලෙසට.එවිට LRC එකෙන් අනුමැතිය ලබා නොදී සිටින බව පැවසුවා.මමත් ඇහැලියගොඩ ආසනයේම තිබෙන සුසාන භූමි පිළිබඳව එතුමා සමඟ කතා කළා.එවිට ඔහු පැවසුවා සභාවේ අකමැත්තෙන් කිසිසේත්ම සුසාන භූමියක් වෙනත් පුද්ගලයෙකුට ලබා නොදෙන බව.පදිංචියට අවසරයක් ලබා නොදෙන බවට.

**සභික සුජීව විජේසූරිය මැතිතුමා:-**

අශෝක මන්ත්‍රීතුමාත් පැවසූ ලෙස අපේ සුසාන භූමි අපි ආරක්ෂා කරගත යුතුයි. මන්ත්‍රීතුමන්ලා ලෙස අපි වැරදි පූර්වාදර්ශත් ලබා නොදිය යුතුයි. එමනිසා සභාව විසුරුවා හැරියහොත් ඉතා ඉක්මනින් එම මිනිසුන්ටත් අසාධාරණයක් නොවන ලෙස අපේ සුසාන භූමියත් අපට පවරාගෙන එම මිනිසුන්ටත් පදිංචි වීමට ස්ථානයක් ලබාදීමට කටයුතු කරන ලෙසට ලේකම්තුමාගෙන් මම ඉල්ලා සිටිනවා.තේ වත්ත ඔවුන්ට ලබාදෙන්න කියන්නේ නැහැ අපි. නමුත් ඔවුන් සිටින ඉඩමට සාධාරණයක් සිදුකරන ලෙසට ලේකම්තුමාගෙන් මම ඉල්ලා සිටිනවා.

**සභික මොහොමඩ් රාෆි මැතිතුමා:-**

එම තේ වත්තෙනුත් යම් කිසි ලාභයකුත් ලැබෙන බැවින් එය සභාවට පවරාගෙන පසුව ඔහුටම බද්දට දිය හැකියි අපිට.

**සභික හරිස්චන්ද්‍ර කිරිඇල්ල මැතිතුමා:-**

මෙය බරපතල ප්‍රශ්නයක් .ඉඩමෙන් කොටසක් දීමට සභාවේ යෝජනා කළහොත් සුසාන භූමි ආඥා පනතට අපි විරුද්ධව කටයුතු කළා වෙනවා.එම නිසා මුලින්ම LRC එකෙන් වෙනම ඉඩමක් ඔහුට ලබාදිය යුතුයි.

**සභික එච්.ටී.තිලකරත්න මැතිතුමා:-**

එහි තිබෙන පාසල තවත් වැඩිදියුණු වුවහොත් සුසාන භූමියේ ප්‍රමාණය තව තවත් අඩුවේවි. අවුරුදු 32ක් ඔවුන් පදිංචි වී සිටිය නිසා සුසාන භූමියටත් කලින් ඔවුන්ට තමා එම භූමිය අයිතිය.එම අයිතිය ඔවුන්ට හිමිවිය යුතුයි.

සභාපතිතුමා:-

මෙම ලිපිය අනුව පොදු කටයුතු සඳහා වෙන්කල කොටසේ තමයි රාජ්‍ය ආයතන ඉදිකර තිබෙන්නේ.සුසාන භූමියට අයත් කොටසේ තමයි අනවසර පදිංචිකරුවන් සිටින්නේ.එම නිසා සුසාන භූමිය අපිට පවරා ගැනීමට කැමතිද නැද්ද කියා අපෙන් අසා තිබෙනවා. එම නිසා අනවසර පදිංචිකරුවන් ඉවත්කර සුසාන භූමියේ කොටස අපට ලබාදෙන ලෙස යෝජනාව අපි අනුමතකර යවමු. අනවසර පදිංචිකරුට ඉඩම් කොටසක් ලබාදීම වෙනුවෙන් අපි වෙනම මැදිහත් වෙමු.

**සභාපතිතුමා :-**

විරෝධතා තිබේනම් දැනුම්දෙන්න.

නිහඬතාවයෙන් පෙනී යන්නේ විරෝධතා කිසිවක් නොමැති බවයි.

**ඒ අනුව, 15/4/22/ඇහැලි/35 අංක හා 2023-03-01 දිනැතිව දිස්ත්‍රික් ඉඩම් ප්‍රතිසංස්කරණ බලමණ්ඩලය ,කලාප සහකාර අධ්‍යක්ෂ (රා.ආ.) විසින් යොමුකර ඇති ලිපියෙහි සඳහන් පරිදි 143- උතුරු කරඳන ග්‍රාම නිලධාරී වසමේ පිහිටි කෝමාරිකාගල වත්ත ඉඩමෙහි සුසාන භූමිය ලෙස භාවිතා කරනු ලබන බිම් කොටසෙහි දකුණු මායිමේ ඉදිකරන ලද තාවකාලික නිවසෙහි පදිංචි අනවසර පදිංචිකරුවන් ඉවත්කර සුසාන භූමිය සහිත ඉඩම් කොටස ප්‍රාදේශිය සභාව වෙත පවරා ගැනීම සඳහා මහා සභා අනුමැතිය ලබාගැනීමේ යෝජනාව සඳහා අනවසර පදිංචිකරුවන් ඉවත්කර ඔවුන් වෙත ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සතු වෙනත් ස්ථානයකින් බිම් කොටසක් ලබාදී සුසාන භූමිය සභාව වෙත පවරා ගැනීමට ඒකමතිකව සභා සම්මත විය.**

**හදිසි යෝජනා**

**01.දිවුරුම්පිටිය වත්ත ගැටහැත්ත දෙමළ විද්‍යාලය අසල කුඩා පාලමේ අබලන්ව ඇති බෝක්කුව ප්‍රතිසංස්කරණය කිරීම**

**සභික හරිස්චන්ද්‍ර කිරිඇල්ල මැතිතුමා:-**

**එම යෝජනාව මම ස්ථිර කරනවා.**

**සභාපතිතුමා:-**

**මේ සම්බන්ධව අපේ ගරු මන්ත්‍රීතුමන්ලා විවිධ අවස්ථාවල ඉල්ලීම් කළා එමෙන්ම** ගැටහැත්ත දෙමළ විද්‍යාලයේ විදුහල්පතිතුමාත් ,පී.කුමාර්රාජ් මහතාත් ඉල්ලීමක් කළා මෙම ස්ථානයෙන් පාසල් දරුවන්ටත් ගමේ ජනතාවටත් යාමට නොහැකිව ඉතාමත්ම අබලන් තත්වයේ එම පාලම තිබෙන බවට.

**02. තක්සේරු දෙපාර්තුමේන්තුවේ 2021-01-19 දිනැති ලිපිය මගින් දැනුම්දී ඇති තක්සේරුව පරිදි ඇහැලියගොඩ ප්‍රාදේශිය සභාව සතු සබරගමු පළාතේ ,රත්නපුර දිස්ත්‍රික්කයේ,ඇහැලියගොඩ ප්‍රාදේශිය සභා බල ප්‍රදේශයේ මීන්නාන ගමේ පිහිටි නිමානි හෝටලය ඉදිරිපිට ගොඩනැගිල්ල සඳහා මාසික වෙළඳපල කුළිය රු.22,500.00ක් වන තක්සේරු මුදල 2023 අප්‍රේල් මස සිට අයකිරීමට මහා සභා අනුමැතිය ලබා ගැනීමේ යෝජනාව.**

**-සභාපතිතුමා විසින් තක්සේරු වාර්තාව කියවයි-**

**සභාපතිතුමා:-**

මෙම ගොඩනැගිල්ල මේවන විට අපි බදු ලබාදී තිබෙනවා.අපි ගිවිසුම්ගත වී තිබෙන්නේ මුදල් වැඩිවීමේ පදනම මත එම මුදල් වැඩිකර අයකර ගැනීමට.

**සභික දිලීන් කරුණාරත්න මැතිතුමා:-**

එම යෝජනාව මම ස්ථිර කරනවා.

අයිතිකරු ලෙස සඳහන් වන්නේ කවුද?

සභාපතිතුමා:-

තක්සේරු වාර්තාවේ අයිතිකරු ලෙස සඳහන් වන්නේ අපෙන් බදු ලබාගත් කෙනා.

**සභික දිලීන් කරුණාරත්න මැතිතුමා:-**

අයිතිකරු පිළිබඳ මාහට අවිනිශ්චිතභාවයක් තිබෙනවා? එවිට අලුත්වැඩියා කටයුතු සිදුකරන්නේ කවුද?

**සභාපතිතුමා:-**

අයිතිකරු ලෙස සාමාන්‍යයෙන් කියනු ලබන්නේ **ප්‍රාදේශිය** සභාවට. අපේ ගොඩනැගිල්ලක් නිසා වරිපනම් බදු ගෙවන්නේ නැහැ. ගිවිසුමේ ඇතුලත්කළ යුතුයි අලුත්වැඩියා කටයුතු බදුකරු විසින්ම කල යුතුයි කියා.

**සභික දිලීන් කරුණාරත්න මැතිතුමා:-**

එලෙස පැහැදිලිව සඳහන් කරන්න.**තක්සේරු වාර්තාවේ අයිකරු ලෙස සඳහන් වන්නේ බදුකරු බව සඳහන් විය යුතුයි.**

**සභාපතිතුමා:-**

**අපේ දේපලක් කුළියට ලබා දීමේදී ජල විදුලි බිල්පත් කුළියට ලබාගත් අය විසින් ගෙවිය යුතුයි.**

**සභාපතිතුමා :-**

විරෝධතා තිබේනම් දැනුම්දෙන්න.
නිහඬතාවයෙන් පෙනී යන්නේ විරෝධතා කිසිවක් නොමැති බවයි.

**ඒ අනුව, තක්සේරු දෙපාර්තුමේන්තුවේ 2021-01-19 දිනැති ලිපිය මගින් දැනුම්දී ඇති තක්සේරුව පරිදි ඇහැලියගොඩ ප්‍රාදේශිය සභාව සතු සබරගමු පළාතේ ,රත්නපුර දිස්ත්‍රික්කයේ,ඇහැලියගොඩ ප්‍රාදේශිය සභා බල ප්‍රදේශයේ මීන්නාන ගමේ පිහිටි නිමානි හෝටලය ඉදිරිපිට ගොඩනැගිල්ල සඳහා මාසික වෙළඳපල කුළිය රු.22,500.00ක් වන තක්සේරු මුදල 2023 අප්‍රේල් මස සිට අයකිරීමට මහා සභා අනුමැතිය ලබා ගැනීමේ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.**

## 6. කාරක සභා වාර්තා

i. **2023-02-01 දිනැති මුදල් සහ ප්‍රතිපත්ති සැකසීමේ කමිටුව - ගරු සභාපතිතුමා**
ii. **2023-02-08 දිනැති මුදල් සහ ප්‍රතිපත්ති සැකසීමේ කමිටුව - ගරු සභාපතිතුමා**
iii. **2023-02-22 දිනැති මුදල් සහ ප්‍රතිපත්ති සැකසීමේ කමිටුව - ගරු සභාපතිතුමා**
iv. **2023-02-06 දිනැති ප්‍රසම්පාදන කමිටුව - ගරු සභාපතිතුමා**
v. **නිවාස සහ ප්‍රජා සංවර්ධන කමිටුව - නොපැවැත්විණි.**
vi. **කාර්මික සේවා කමිටුව - නොපැවැත්විණි.**
vii. **පරිසර හා පහසුකම් කමිටුව -නොපැවැත්විණි.**
viii. **විදුලිය, ජලය,රථවාහන නැවතුම්,පදික වෙළඳාම පිළිබඳ උපදේශක කාරක සභාව - නොපැවැත්විණි.**
ix. **සෞඛ්‍ය හා සනීපාරක්ෂක කමිටුව - නොපැවැත්විණි.**

## 7. ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා

- ප්‍රා.ස.14 හා 16 (**පෙබරවාරි මස**) මහා සභා අනුමැතියට යෝජනා කරමි.
- හිඟ ආදායම් වාර්තාව මහා සභා අනුමැතියට යෝජනා කරමි.

**සභික ආර්.ධනරත්න මැතිතුමා:-**

එම යෝජනාව මම ස්ථිර කරනවා.

**සභාපතිතුමා :-**

විරෝධතා තිබේනම් දැනුම්දෙන්න.
නිහඬතාවයෙන් පෙනී යන්නේ විරෝධතා කිසිවක් නොමැති බවයි.

**ඒ අනුව, ප්‍රා.ස.14 හා 16 (පෙබරවාරි මස) හා හිඟ ආදායම් වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.**

**08. මහා සභාවට පැමිණිය නොහැකි බව දන්වා එවා ඇති ලිපි සභාගත කිරීම.**

**සභාපතිතුමා :-**

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රිනී රසිකා අරුණකාන්ති මැතිනිය, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩබ්.ප්‍රේමචන්ද්‍ර මැතිතුමා 2023 මාර්තු මස මහා සභාවට පැමිණිය නොහැකි බව දුරකථනයෙන්, දන්වා තිබෙනවා. එම නිවාඩු අනුමත කිරිමට යෝජනා කරනවා.

**සභික රේවතී නන්දා මැතිනිය:-**

අද දින නොපැමිණි මන්ත්‍රීතුමන්ලාගේ නිවාඩු ස්ථිර කරනවා.

**සභාපතිතුමා :-**

විරෝධතා තිබේනම් දන්වන්න.

නිහඬතාවයෙන් පෙනී යන්නේ විරෝධතා කිසිවක් නොමැති බවයි.

ඒ අනුව, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රිනී රසිකා අරුණකාන්ති මැතිනිය, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩබ්.ප්‍රේමචන්ද්‍ර මැතිතුමා , 2023 මාර්තු මස නිවාඩු අනුමත කිරිම ඒකමතිකව සභා සම්මත විය.

**9. වෙනත් කාරණා**

- **පෞද්ගලික මන්ත්‍රී පැහැදිලි කිරීම්.**

**සභික ශිරාන් සමරතුංග මැතිතුමා:-**

මේ දිනවල පාසල්වල උත්සව පැවැත්වීමට දෙමාපියන්ගෙන් මුදල් ඉල්ලා සිටිනවා.පන්ති කාමරවල හුණු ගෑමට යැයි පවසා ළමුන්ගෙන් රු.1000.00,2000.00 පමණ ඉල්ලා සිටිනවා. හාල් කිලෝ එකක් පවා මිලදී ගැනීමට නොහැකි තත්වයක එම ළමුන් සිටින්නේ. පාසල් බෑගයක් රු.5000.00ක් පමණ වෙනවා. පොත්පිත ගන්න බැහැ.මෙවන් වැඩපිළිවෙලවල් නැවැත්වීමට ගරු ආණ්ඩුකාරතුමාට දන්වා යැවිය යුතුයි.ඔබතුමන් ඉල්ලීමක් සිදුකරනවානම් හොඳයි. ඒ ළමයි කොන් වීමක් සිදු වෙනවා එම මුදල් දීමට නොහැකි වූ විට.මෙම අර්බුදය බරපතල ලෙස සමාජය හමුවේ තිබෙනවා.සෑම තැනම උත්සව.වියුෂන් කඩ වගේ දාලා.ළමයි මෙන්ම දෙමාපියනුත් අසරණ වෙලා.හැකිතරම් මෙයට මැදිහත්වී ගරු අණ්ඩුකාරතුමාගෙන් ඉල්ලීමක් සිදුකරන ලෙස ඉල්ලා සිටිනවා.

එමෙන්ම අද දින මම සභාවට පැමිණෙන අවසන් දිනයද දන්නේ නැහැ. එම නිසා නිලධාරීතුමන්ලාට මගෙන් යම්කිසි අඩුපාඩුවක් වූවාද දන්නේ නැහැ. අපි මේ සෑම දෙයම සිදුකරනු ලබන්නේ මහජනාව වෙනුවෙන්.හිතවත් මන්ත්‍රීතුමන්ලාටත් මගෙන් වරදක් වූවාද දන්නේ නැහැ. පෞද්ගලිකව කිසිඳු අමනාපයක් කිසිවෙක් සමඟ නැහැ. අපේ දේශපාලන මතවාද නිසයි ගැටුම් ඇති වූවානම් ඇති වුණේ.අපි පැමිණි පැත්තටත් අපි සමහර අවස්ථාවල ගැරහීම් සිදු කළේ එම නිසයි. නිතරම නැතිබැරි පන්තිය වෙනුවෙන් තමයි අප පෙනී සිටියේ.සභාව පැවැත්වූ සෑම දිනකම මම පැමිණියා. නොපැමිණි දිනයක් නැහැ.ජනතාව වෙනුවෙන් තමයි මම සමහර අවස්ථාවල ගරු සභාපතිතුමා සහ මන්ත්‍රීතුමන්ලා සමඟ ගැටුම් ඇතිකර ගනු ලැබුවේ. එම නිසා මාගෙන් යම් කිසි අඩුපාඩුවක්,සිත් තැවුලක් සිදු වූවානම් එයට දහස් වාරක් සෑම දෙනාගෙන්ම සමාව ඉල්ලා සිටිනවා. සියලුම දෙනාට මෙම සභාවට නැවත පැමිණීමට ධෛර්යය ,ශක්තිය ,වාසනාව ලැබේවා පතමින් මම නිහඬ වෙනවා.

**සභික රසිකා වසන්ති සිරිවර්ධන මැතිනිය:-**

බුළුගහපිටිය වසමේ වතුර සම්බන්ධ ගැටළුවක් තිබෙනවා. එම ස්ථානයෙන් කාණුව ඉදිරියට කපා ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකර දෙනලෙස ඉල්ලා සිටිනවා.

**සභික එස්.කරුණාදාස මැතිතුමා:-**

මම මෙම සභාවට පැමිණි අවුරුදු 05 තුළ මාහට උදව් කළ නිලධාරී මණ්ඩලයක් සිටිනවා. ඔවුන්ටත් ස්තුතිවන්ත විය යුතුයි. පළමුව කිව යුතුයි ,ගරු ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාගේ සෞභාගෞය් දැක්ම තුළ යම් වැඩ කොටසක් සිදුකිරීමට අපි බලාපොරොත්තු වී සිටියා. නමුත් යම් වැඩකොටසක් සිදුකළා. එහිදී ගරු අමාත්‍යතුමිය සෞඛ්‍ය ඇමති වී සිටි කාලයේදී නාපාවල වෛද්‍ය මධ්‍යස්ථානයේ එම ගොඩනැගිල්ල සාදා නිමකළ හැකි වුණා. එමෙන්ම ගනේගොඩ වෛද්‍ය මධ්‍යස්ථානයේත් කොන්ත්‍රාත්කරුගේ අසමත් වීම නිසා සියල්ල නිමකිරීමට නොහැකි වුණා. මේ වසර තුළ අලුතින් ඇස්තමේන්තු සකස්කර එවා තිබෙනවා. ඒ වෙනුවෙන් ගරු අමාත්‍ය පවිත්‍රාෙද්වි වන්නිආරච්චි මැතිනියට සහ ගරු කංචන ජයරත්න මැතිතුමාට මාගේ ගෞරවනීය ස්තුතිය පුදකර සිටිනවා. එමෙන්ම පාසල් මට්ටමින් ඉද්දමල්ගොඩ විද්‍යාලයට පරිගණක 20ක විද්‍යාගාරයක් සහ ගරු නිවාසයේ වහලය අලුත්වාඩියා කිරීම සිදුකර දෙනු ලබුවා. ඒ සඳහා සහාය දුන් ලේකම්තුමා,කුමාරගේ මහතා,කාර්මික නිලධාරී නිශාන්ත රාමනායක මයාට මම ස්තුතිවන්ත වෙනවා. මීන්නාන උඩුවක මාර්ගය,ගැටහැත්ත කරඳන මාර්ගය,ඉද්දමල්ගොඩ ගනේගොඩ මාර්ගයේ අඩුපාඩු සකස්කර වැඩ අවසන් කිරීමට මාහට මුදල් ප්‍රතිපාදන ලබාදුන් පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම්තුමාට මේ අවස්ථාවේදී ගෞරවනීය ස්තුතිය පුදකර සිටිනවා. තවද ඉද්දමල්ගොඩ,ගනේගොඩ,උඩුවක යන ග්‍රාම නිලධාරී වසම්වල කෘෂි ව්‍යාපෘති සිදුකරගෙන යාම සඳහා ප්‍රතිපාදන ලබාදුන් කෘෂිකර්ම අමාත්‍යාංශයේ ලේකම්තුමා,සැලසුම් අධ්‍යක්ෂ වීරසේකර මහතා සහ කාර්මික නිලධාරී ජගත් මහතාට මාගේ කාරුණික ස්තුතිය පුදකර සිටිනවා. එමෙන්ම මාහට මෙම සභාවෙනුත් ලක්ෂ 05ක පමණ මුදල් ප්‍රමාණයක් ලබා දුන්නා. එයිනුත් මම විශාල වැඩ කොටසක් සිදු කළා. ඒ වෙනුවෙන් හිටපු ගරු සභාපති තිලක් රෝහණ ජයවික්‍රම මැතිතුමාව මම සිහිපත් කරනවා.එමෙන්ම මෙම සභාවේ ගරු සභාපතිතුමා,ලේකම්තුමා ඇතුළු කාර්ය මණ්ඩලයට අපට සෑම අවස්ථාවකදීම උදව් උපකාර සිදුකළා.ඔවුන්ටත් මාගේ ගෞරවනීය ස්තුතිය පුදකර සිටිමින් පළාත් සභාවේ මම ස්තුති කළ සියලුම දෙනාට ස්තුති ලිපියක් සභාව මගින් යනව ලෙස මම ඉල්ලා සිටිනවා.පළාත් සභාවේ සියලුම මුදල් ලබා දුන්නේ ගරු ආණ්ඩුකාරතුමාත් එතුමාගේ ලේකම්තුමාවත් මම ගෞරවයෙන් සිහිපත් කරනවා.එමෙන්ම සියලුම ගරු මන්ත්‍රීතුමන්ලා සහ මන්ත්‍රීතුමියන්ලාට මාගේ ගෞරවනීය ස්තුතිය පුදකර සිටිමින් මාගේ කථාව අවසන් කරනවා.ස්තුතියි.

**සභික ආර්.ඒ.නන්දසේන මැතිතුමා:-**

මෙය අපගේ අවසන් හමුවීමද දන්නේ නැහැ .එම නිසා මාහට ඉල්ලීමක් තිබෙනවා ජනිත ගාඩ්න්හි අපගේ ඉඩම් කොටස ආරක්ෂාකර ගැනීමට වැඩපිළිවෙලක් යොදන ලෙසට.එය වැසි කාලයේ සේදී යනවා.

ගත වූ වසර 05 තුළ අපි ගරු සභාපතිතුමන්ලා දෙදෙනෙක් යටතේ සහ ලේකම්තුමන්ලා තිදෙනෙක් යටතේ වැඩ කටයුතු සිදුකළා. එතුමන්ලාටත්. සෑම වැඩකදීම සහාය ලබාදුන් නිලධාරී මණ්ඩලයටත් ,සුහදව වැඩකටයුතු සිදුකළ අපේ ගරු මන්ත්‍රීතුමන්ලාටත් මගේ ගෞරවනීය ස්තුතිය පුදකර සිටිමින් ඉදිරියේදී ඡන්දය ඉල්ලා සිටින මන්ත්‍රීතුමන්ලාට නැවත වාරයක් මෙම සභාවට පැමිණ ඇහැලියගොඩ ජනතාවට සේවයක් සිදුකිරීමට හැකියාව ලැබේවා කියා පතමින් මම නිහඩ වෙනවා. ස්තුතියි.

**සභික ආර්.ධනරත්න මැතිතුමා:-**

විලේගොඩ ප්‍රෙද්ශයේ වරිපනම් ගෙවීමට නොහැකි අසරණ පවුලක් පිළිබඳ ලිපියක් ඔබතුමන්ට ඉදිරිපත් කළා.එම පීටර් යන අයගේ පුතා ගසකින් වැටී මරණයට පත් වුණා. භාර්යාවට ඇවිදීමට නොහැකියි. පියා අසනීප වයස්ගත පුද්ගලයෙක්.ග්‍රාම නිලධාරීතුමියගේ ලිපියක්ද ඉදිරිපත්කර තිබෙනවා. සාධාරණයක් ඉටුකරන ලෙස ඉල්ලා සිටිනවා

**සභාපතිතුමා :-**

එසේ ඉල්ලීමක් ඉදිරිපත් කරනවා නම් සභා වාර්තාවේ න්‍යාය පත්‍රයේ යෝජනාවක් ලෙස ඇතුලත්කර විධිමත් ලෙස ආණ්ඩුකාරතුමාගේ අනුමැතියට යවමු.

**සභික ආර්.ධනරත්න මැතිතුමා:-**

1991 වසරේ සිට රියදුරෙක් ලෙස සේවය කළ මම අවස්ථා 05 කදීම මෙම සභාවේ මන්ත්‍රීවරයෙක් ලෙස නියෝජනය කළා.ගරු මන්ත්‍රීතුමන්ලගේ ඡන්දයෙන් එක් අවස්ථාවකදී සභාපතිවරයා ලෙස පත්වුණා. සමහර මාගේ අනියම් ප්‍රකාශත් සමඟ සභාවේ මන්ත්‍රීතුමන්ලා සමඟ අමනාපකම් ඇතිවුණා.ඒ පිළිබඳව සමාව ඉල්ලා සිටිනවා.එමෙන්ම පොහොට්ටුව එ.ජා.පක්ෂයත් සමඟ එක්වීමත් සමඟ අපගේ සමඟිය නැතිවී ගියා. ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා සහ මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ කාලයේ යම් සංවර්ධන කටයුතු අපි සිදුකළා. දැන් අපි වෙන් වුනත් ඔවුන්ට එම ගෞරවය පුද කරනවා.ඉදිරියේදී මම ඡන්දය ඉල්ලා සිටින්නේ විලේගොඩ ප්‍රදේශයෙන් නිදහස් ජනතා පෙරමුණ යටතේ හෙලිකොප්ටර් ලකුණින්. ඔබතුමන්ලාගේ ආශීර්වාදයත් සහයෝගයත් ලබාදෙන ලෙස ඉල්ලා සිටිමින් මම නිහඩ වෙනවා.ස්තුතියි.

**සභික එච්.ටී.තිලකරත්න මැතිතුමා:-**

බොහෝ විට මෙය අපගේ අවසාන මහා සභා රැස්වීම විය හැකියි. හිටපු සභාපතිතුමාගේ අභාවයත් සමඟ මාහට මෙම සභාව නියේජනය කිරීමට අවස්ථාව ලැබුණා.එතුමාවත් ඉතාමත් ගෞරවයෙන් සිහිපත් කරනවා.මාව මේ සඳහා පත්කිරීමට සහාය දැක්වූ ගරු සභාපතිතුමාටත්,සුජීව මන්ත්‍රීතුමාටත්,කරුණාදාස මන්ත්‍රීතුමා,ධනරත්න මැතිතුමා, හිටපු මන්ත්‍රීතුමන්ලාටත් ස්තුතිවන්ත වෙනවා. සභා වාර 05ක් මම නියෝජනය කළා. එහිදී අපි බොහෝම සුහදව කටයුතු කළා.ඒ සම්බන්ධයෙන් ගරු සභාපතිතුමාටත්,මන්ත්‍රී මණ්ඩලයටත්,නිලධාරීතුමන්ලාටත් ස්තුතිවන්ත වෙනවා.

අවසාන වශයෙන් කීමට ඇත්තේ ,මේ රට අද අසීරු තත්වයකට පත්ව තිබී,යම් මට්ටමකින් හුස්ම ගැනීමට හැකි තත්වයකට පත්ව ඇති මොහොතක්.ධනරත්න මන්ත්‍රීතුමා පැවසූ ලෙස ,එකට සිටි කණ්ඩායම අදවන විට දුරස්ව වෙන්වී තිබෙනවා.නමුත් මේ අවස්ථාවේදී අපි එක්ව ගෙනයන මෙම වැඩපිළිවෙල සාර්ථක කර රට යම් තත්වයකට ගොඩ නගාගත් පසු, ඒ තුළින් යම් ස්ථාවරත්වයක් ඇතිකර ගත් පසු ,අපේ පෞද්ගලික දේශපාලන මතවාද අනුව කටයුතු කිරීමට හැකිනම් එය තමා රටේ පුරවැසියන් ලෙස සිදුකල හැකි ලොකුම සේවය.එම නිසා මගේ සහෝදර මන්ත්‍රීතුමන්ලාට මම ආරාධනා කරනවා අපි නැවත එක්ව එක ගමනක් යමු.
මේ අවස්ථාවේදී මාහට මතක් වෙනවා අපගේ මහාචාර්ය ඩබ්.ඒ.එස්.කරුණාරත්න මහතා කිවූ කතාවක් එනම් ,"චංචල ලෝකයේ ස්ථිර නිගමන වලට එළඹෙන්නා, විචාර බුද්ධියට පිටුපාන්නෙක්" බව.ඒ කියන්නේ රනිල් වික්‍රමසිංහ යනු අපගේ සදාකාලික හතුරෙක් බවට නොසිතන ලෙස.එම නිසා අපි හැරදා ගිය කණ්ඩායමට මතක් කරනවා මේ රට නැවත ගොඩනැගීමට සියලු දෙනාම එක්වෙමු කියා. සියලු දෙනාටම සුභ අනාගතයක් ප්‍රාර්ථනා කරනවා.

**සභික දිලීන් සමුදිත කරුණාපාල මැතිතුමා:-**

2018දී සැවොම මහින්ද රාජපක්ෂ මැතිතුමාව ආල ගිය විට අපි වමේ පක්ෂ සියල්ල එක්ව අපි අවුරුදු තුනක් කල් දාපු මැතිවරණය ඉල්ලා සිටියා. පසුව පළාත් පාලන මැතිවරණයෙන් විශේෂ ජයග්‍රහණයක් පොදුජන පෙරමුණ ලෙස ලබාගත්තා. පසුව පැමිණි ජනාධිපතිවරණයේදී අපි විශාල කැපකිරීමක් සිදුකර සෞභාග්‍යයේ දැක්ම හා ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා දිනවීමට ක්‍රියා කළා.පසුව ක්‍රම ක්‍රමයෙන් එම 69ලක්ෂයේ ජනතා වරමට පයින් ගසන තත්වයකට පත් වූ පසු අපි එය එපාය කියා එළිය බැස්සා. එවිට දැන් ක්‍රියාත්මක වන්නේ 69ලක්ෂයේ ජනවරමවත් , 69ලක්ෂය ප්‍රාර්ථනා කළ එම සෞභාග්‍යයේ දැක්ම ප්‍රතිපත්තියවත් නොවෙයි.කෙසේ වෙතත් අද වන විට අප විවිධ මති මතාන්තර වල හිඳිමින් දේශපාලනය කරන අවස්ථාවක මේ රටේ තිබෙන අර්බුදය අප මැනවින් දන්නවා.
අපි මෙම අවුරුදු 05 තුළ ශ්‍රී ලංකා මහජන පක්ෂය ලෙස සෑම විටම හොඳ දෙයට හොඳයි කිවුවා. නරක දෙයට නරකයි කිවුවා. හිටපු ගරු සභාපති තිලක් රෝහණ ජයවික්‍රම මැතිතුමාත් හැකි අයුරින් අවස්ථානුකූලව ප්‍රතිපාදන ලබාදී අපට සහාය ලබාදුන්නා. පසුව පත්වූ වැඩ බලන ගරු සභාපති රුවන් ලියනගේ මැතිතුමාත් විවිධ අවස්ථාවලදී සහයෝගය ලබාදුන්නා. මත ගැටුම් ඇති වුවත් ජේෂ්ඨ මන්ත්‍රීතුමන්ලා අපිට යා යුතු දිශානතිය පෙන්වා දුන්නා. මගේ නම් පෞද්ගලික මතය අපි තරුණ පරපුරට මේ පුටුව ලබාදී අපි යනවා නම් ඉදිරියට යා යුතුයි කියා. රටේ මූලික කණුව ප්‍රජාතන්ත්‍රවාදය කියා සිතා තමා අපි දේශපාලනය සිදුකරනු ලබන්නේ.
2018 වසරේ පළාත් පාලන මැතිවරණයෙන් තේරී පත්වූ ශ්‍රී ලංකා මහජන පක්ෂයේ තිදෙනෙක් සිටිනවා.තිලක් රෝහණ ජයවික්‍රම මැතිතුමා අද ජීවතුන් අතර නැහැ. ගයානි ප්‍රියදර්ශනී මැතිනියගේත් මගේත් පක්ෂයක් ලෙස ප්‍රණාමය පුදකර සිටිනවා ගරු සභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලයට,ලේකම්තුමා ඇතුළු නිලධාරී මණ්ඩලයට සහ අපට සහයෝගය දැක්වූ මැති ඇමතිතුමන්ලාට .ප්‍රජාතන්ත්‍රවාදී මූලධර්මය අනුව ඉක්මනින්ම ඡන්දයක් පවත්වා අලුතින් සභාවක් පත්කර ගනු ඇතැයි යන විශ්වාසය අපට තිබෙනවා.එම සුබ පැතුමත් සමඟ මගේ කතාව අවසන් කරනවා. ස්තුතියි.

**සභික පී.හරිස්චන්ද්‍ර මැතිතුමා:-**

ඇහැලියගොඩ ප්‍රාදේශිය සභා ඉතිහාසයේ අත්දැකීම් බහුලම සභිකයින් තමයි මෙම සභාවේ තේරී පත්ව සිටින්නේ. මක් නිසාද මෙම සභාව කිසි දිනක බලාපොරොත්තු නොවූ අත්දැකීම් සමුදායකට මුහුණ දුන්නා. ජනාධිපතිවරු හා ආණ්ඩු 03ක් යටතේ මෙම සභාව පැවැත්වූවා.එමෙන්ම ඉතිහාසයේ කිසි දිනක නොඇසූ කොරෝනා වසංගතයට අපි සභාවක් ලෙස සාර්ථකව මුහුණ දුන්නා. බලාපොරොත්තු නොවූ අරගලයකටත් සභිකයින් ලෙස සාර්ථකව මුහුණ දුන්නා.ලංකා දේශපාලන ඉතිහාසයේ කිසිදිනක පැවතුණු ආණ්ඩුව යටතේ තමයි සබාව පැවැත්වූයේ .නමුත් යහපාලන ආණ්ඩුව යටතේ රැල්ලක් පැමිණ අපේ සභාව වෙනත් පක්ෂයක් යටතට පැමිනුණා.එමෙන්ම ඉතිහාසයේ පළමු වතාවට ගරු සභාපතිතුමෙක් සභාපති ධුරයේ සිටිද්දීම මියගොස් අලුතින් සභාපතිතුමෙක් පත්වුණා.මෙවන් අත්දැකීම් සම්භාරයකට අපට මුහුණ දීමට සිදු වුණා.

එමෙන්ම සභිකයන් ලෙස අපට අලුත් දේශපාලන සංස්කෘතියකුත් බිහි වුණා.2011 වසරේ ප්‍රාදේශිය සභා මන්ත්‍රීවරයෙක් ලෙස මම සිටින විට මට තමා වැඩියෙන්ම වෛර කළේ,චෝදනා කළේ.මම ඒ පිළිබඳව කනගාටු වන්නේ නැහැ.නමුත් අද අපි එක කණ්ඩායමක් ලෙස සිටිනවා.මෙම නව දේශපාලන සංස්කෘතිය තුළ අප තේරුම්ගත යුතුයි කෙදිනකවත් රැල්ලට දේශපාලනය කිරීම හොඳ නැති බව .යහපාලන රජය යටතේ ගෝඨාභය මැතිතුමාට විශාල රැල්ලක් පැමිණියා.එහිදී එ.ජා.පක්ෂය සෝදා පාළුවට ලක්වුණා.ප්‍රාදේශිය සභා මන්ත්‍රීවරයෙක් තම කොට්ඨාශයට සිදුකල විශාලතම වැඩ කොටස සිදු කළේ යහ පාලන ආණ්ඩුව යටතේ.පසුව ජනතා රැල්ලක් පැමිණ ගෝඨාභය මැතිතුමාට විශාල ජන වරමක් ලබා දුන්නා.පසුව නොයෙක් උද්දච්චකම් නිසා ආර්ථිකය කඩා වැටුණා.නමුත් අපි කිසි දිනක අනුමත නොකරන ප්‍රජාතන්ත්‍ර විරෝධී ඝාතන ,දේපල විනාශ කිරීම්,තර්ජන සිදු වුණා. පසුව ව්‍යවස්ථානුකූලව නව ජනාධිපතිවරයෙක් එ.ජා.පක්ෂයේ ජාතික ලයිස්තුවෙන් අමාරුවෙන් පත්ව ආ පුද්ගලයා ජනාධිපතිධුරය භාරගත්තා.එම පුද්ගලයා අදවන විට ලංකාවේ ආර්ථිකය නගා සිටුවා,ලංකාව යම් කිසි දිශානතියකට රැගෙන යන බව අප සැවොම දන්නවා.
ඊට විරුද්ධව නැවත රැළි පැමිණ සිටිනවා. රැල්ලට යන්නේ ,මැරුණු මාළු.පණ ඇති මාළුන් කෙදිනකවත් රැළි වලට ගසා යන්නේ නැහැ.එම නිසා අප ශ්‍රී ලාංකික ජාතියක් ලෙස මෙම රැළි පරාජයට පත්කල යුතුයි.අපේදේශපාලන වාද භේද නොතකා අප එක්විය යුතුයි.

මම මෙය අනාවැකියක් කියන්නේ,තව අවුරුද්දක් යාමට පෙර මේ රටේ දේශපාලන පක්ෂ දෙකයි පැහැදිලිවම සිටින්නේ.එකක් මේ රටට ආදාරය කරන ජනතාව එක්වී පිහිටුවන සන්ධානය.අනෙක කුහක දේශපාලන අරමුණු ඇති කණ්ඩායම.එම නිසා අපි ප්‍රාදේශිය සභා මන්ත්‍රීවරයෙක් ලෙස මෙම ලැබුණු අත්දැකීම් සමුදායෙන් ජනතාව බේරා ගැනීමට ,සුබිත මුදිත ආර්ථිකයක් ඇති කිරීමට සියලු දෙනාම එක්වෙමු.තවද, මෙම බල සීමාවේ අප වෙනුවෙන් ඡන්දය ලබාදෙන සියලුම ජනතාවට සේවයක් ලබාදීමට එකට අත්වැල් බැඳ ගැනීමට කාලය උදා වී තිබෙනවා.එබැවින් මෙම අලුත් දේශපාලන සංස්කෘතියට හුරුවීමට අප සියලුදෙනාම එක්වෙමු.

අද දින මෙම ප්‍රාදේශිය සභාවේ අවසාන දිනය වීමට ඉඩ තිබෙනවා. මේ සඳහා සහයෝගය ලබා දුන් සැම මන්ත්‍රීවරයෙක්ටමත් ගෞරවය ස්තුතිය පුදකර සිටිනවා. ගරු සභාපතිතුමාත් වෙදාටත් වඩා ලෙන්ගතුකමකින් අපි සැවොම සාකච්ජා කරමින් වැඩ කටයුතු සිදු කළා. මෙහි සිටින සභිකයින් සියළු දෙනාමත් ඉතාමත් ලෙන්ගතුව මාත් සමඟ වැඩ කටයුතු සිදු කළා. එමෙන්ම ජගත් ලේකම්තුමා අපිට ලබාගන්න බැරි වුණත් ඔහුත් මතක් කරනවා. එමෙන්ම මේ අවස්ථාවේ සිටින ලේකම්තුමා මාත් නොසිතූ ලෙස ජනතාවාදීව,සියලුම සභිකයින්ගේ සහාය ලබාගෙන මේ වැඩ කටයුතු අකුරටම ඉටු කරනවා. එතුමාටත් ස්තුතිවන්ත වෙනවා.එමෙන්ම කාර්ය මණ්ඩලයේ සුළු සේවකයාගේ පටන් සියලුම නිලධාරී මණ්ඩලයටත් මගේ ගෞරවය ස්තුතිය එ.ජා.පක්ෂ මන්ත්‍රී කණ්ඩායම වෙනුවෙන් පුදකර සිටිනවා. එමෙන්ම මාව මේ ස්ථානයට පත්කර එවූ ඇහැලියගොඩ වත්ත,අස්ගඟුල උතුර/දකුණ, කැන්දන්ගමුව නගරය සියලුම ජනතාවට මම ස්තුතිවන්ත වෙනවා. එමෙන්ම මෙම දේශපාලනය මා හට ඉගැන්වූ මගේ පියතුමා හිටපු පළාත් සභා මන්ත්‍රී ,පළාත් සභාවේ හිටපු විපක්ෂ ප්‍රධාන සංවිධායක සිරිපාල කිරිඇල්ල මැතිතුමාටත් මගේ ගෞරවය ස්තුතිය පුදකර සිටිනවා.ඉදිරියේදී නව දේශපාලන සංස්කෘතියක් ඔස්සේ ගමනක් ගොස් මේ රටට සේවය කිරීමේදී අප සියලු දෙනාම එකට එක්වෙමු කියා සිහිපත් කරමින් මගේ කතාව අවසන් කරනවා.ස්තුතියි.

**සභාපතිතුමා:-**

අද දින සභාවේ අවසාන දිනය ලෙස සැම දෙනාම තම තමන්ගේ අදහස් ඉදිරිපත් කළා. අපි අපට කළ හැකි සියලු දේම තේරුම් අරන් එකට එක් වී වැඩ කටයුතු සිදුකරගෙන ගියා. එහිදී විවිධ වූ චෝදනා ,හැල හැප්පීම් සියල්ලම සිදු වුණේ අපි අතරේ හිත්තැවුලක් ඇතිකර ගැනීමට නොවෙයි.එමෙන්ම 2018 වසරේ මැතිවරණයට ඉදිරිපත් වන විට අපේ ජයග්‍රහණයන් වෙනුවෙන් නායකත්වය ලබාදුන් ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ නායක හිටපු අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාත්,පක්ෂයේ මහ ලේකම් බැසිල් රාජපක්ෂ මැතිතුමාත්,ආසනයේ දිස්ත්‍රික් නායක වනජීවී සහ වන සම්පත් ගරු අමාත්‍ය පවිත්‍රා දේවි වන්නිආරච්චි මැතිනිය,සබරගමු පළාත් සභාවේ ගරු සභාපති කංචන ජයරත්න මැතිතුමාටත් ගෞරවයෙන් මතක්කර සිටිනවා. ගරු සභාපති තිලක් රෝහණ ජයවික්‍රම මැතිතුමා සභාපතිධුරට පත් වී එතුමාගේ අභාවයෙන් පසුව වැඩ බලන සභාපතිවරයා ලෙස මා මෙතුවක් කල් වැඩ කටයුතු සිදුකරගෙන යනවා.ඒ සඳහා සහයෝගය දැක්වූ සියලු දෙනාටත් මගේ ගෞරවය ස්තුතිය පුදකර සිටිනවා.

එමෙන්ම අපට පළාත් සභාව තුළින් ගරු ආණ්ඩුකාරතුමා ප්‍රධාන අමාත්‍යංශවල ලේකම්තුමන්ලා , ලේකම්තුමියන්ලා, ප්‍රධාන ලේකම්තුමා ප්‍රධාන සියලුම අමාත්‍යංශවල ලේකම්තුමන්ලා ,ලේකම්තුමියන්ලා, පළාත් පාලන කොමසාරිස්තුමා, සහකාර පළාත් පාලන කොමසාරිස්තුමා ඇතුළු සියලුම නිලධාරීතුමන්ලා විවිධ වූ අවස්ථාවන් වලදී අපට ලබාදුන් සහයෝගය වෙනුවෙන් ස්තුතිය පුදකර සිටිනවා.එමෙන්ම මෙම වැඩකටයුතු සිදුකර යාමේදී ගරු ලේකම්තුමා ,වාර්තා කරන නිලධාරීන්,ප්‍රධාන කළමනාකරණ සහකාර නිලධාරිනිය ඇතුළු සියලුම කාර්ය මණ්ඩලයට සහ අපගේ කසළ කළමනාකරණ කටයුතු සිදුකරන සනීපාරක්ෂක සේවයේ යෙදී සිටින සියලුම දෙනාටමත් අපගේ ස්තුතිය පුදකර සිටිනවා.එමෙන්ම මෙම වැඩකටයුතු සිදුකරගෙන යාමේ දී අප ප්‍රදේශයේ තිබෙන සියලුම රාජ්‍ය ආයතන මෙන්ම වසම්වල වැඩකටයුතු සිදුකරන රාජ්‍ය නිලධාරීන් සියලු දෙනාම විවිධ වූ අවස්ථාවන් වලදී දැක්වූ සහයෝගයට ස්තුතිය පුදකර සිටිනවා.අප විසින් යම් කිසි තීරණයක් ගනු ලැබුවා නම් එම තීරණය තුළ අප සියලු දෙනාම පිටුපසින් සිටියා.විවිධ වූ හැල හැප්පීම් තිබුනත් ,එකා

මෙන් පෙනී සිට අප විසින් මිනිසුන්ට අවශ්‍ය වැඩකටයුතු සිදුකරනු ලැබුවා.සමස්ත ජනතාව වෙනුවෙන්ම පෙනී සිටීම පිළිබඳව ගරු මන්ත්‍රීතුමන්ලාට මගේ ගෞරවය මෙහිදී පුදකර සිටිනවා.

දේශපාලනය යනු ඉතාමත්ම බුද්ධිමත්ව ,ඉවසිලිවන්තව සිදුකල යුතු දෙයක්.යම්කිසි අවස්ථාවන් වලදී අපහසුතාවයට පත් වුවත් අප මිනිසුන්ට තිබෙන ගෞරවය පිළිබඳ සිතා එම ස්ථාන වලින් ඉවත්ව ගොස් තිබෙනවා. මේ රට ආර්ථික අර්බුදයෙන් ගොඩගැනීමට වෙහෙසෙන අවස්ථාවක විවිධ වූ පක්ෂවල අය මෙහි සභාපති වෙලත් ඉවරයි. සමහරු ජනාධිපති වෙලා.මොන විධියට පෙළ ගැසුනත් අප දැක තිබෙනවා මේ රටට අවශ්‍ය වෙලාවට අවශ්‍ය නායකත්ව දැන් ලැබී තිබෙනවා.එම නිසා මෙම ආර්ථික අර්බුදයෙන් ගොඩ ඒමට ගන්නා වූ උත්සාහයන් සඳහා සියලුමදෙනා එක්ව සහයෝගය ලබා දෙමු.

සමහරු තමන් ඉදිරියේ සිටින පුද්ගලයාට තර්ජනය කර මේ රටේ නායකත්වයට ඒමට උත්සාහ දරනවා. සමහරු කතා කරන්නවත් දන්නේ නැහැ.එම පක්ෂවල අය මේ රටේ නායකත්වය භාර ගතහොත් ජනතාවට කුමක් සිදුවේද දන්නේ නැහැ.මේ ප්‍රාදේශිය සභාව ඉදිරියේදී කුමන තත්වයකට පත් වුවත් මිනිසුන්ගේ සේවය උදෙසා ඉදිරියටත් කැපවෙන බව මතක් කරමින් අද දින මෙම සභාව ඉතාමත් සාර්ථකව සිදුකරගෙන යාම සඳහා සහයෝගය දැක්වූ ගරු මන්ත්‍රීතුමන්ලාටත්, ලේකම්තුමා ප්‍රධාන වාර්තා කරන නිලධාරී දෙපළටත් ස්තුතිවන්ත වෙමින්. අදට නියමිත සභා රැස්වීම මින් නිමා කරනවා. දැන් වේලාව ප.ව.2.34 යි.

රුවන් ලියනගේ,
සභාපති,
ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව.